


## ආචාර්ය නෙළුක මදුරංග කරන්නාගොඩ

BSc.Management Hons (USJP) Accounting (Sp) Minor Information Systems & Decision Science,
PhD in Library and Information Sciences (IIC University of Technology)
Master of Public Management (SLIDA), P.G.Dip in Public Management (SLIDA),
CMA - Professional I, Certified Business Accountant (ICASL),
Dip. in CATS, Academic Researcher,


නෙළුක මදුරංග කරන්නාගොඩ මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලයේ පරිගණක පද්ධති පිළිබඳ සහකාර පුස්තකාලයාධිපතිවරයා ලෙස දැනට කටයුතු කරන අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී ගණකාධිකරණ ප්‍රථම උපාධිය ද රාජ්‍ය කළමණාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය ද ලබාගෙන ඇත. ඊට අමතරව ඔහු සහතිකලත් ව්‍යාපාර ගණකාධිකාරවරයෙකු ද වේ. තොරතුරු කළමණාකරන පද්ධති පිළිබඳ ග්‍රන්ථයක් සම්පාදනය කරමින් ග්‍රන්ථකරණයට පිවිසුණු කරන්නාගොඩ මහතාගේ ප්‍රථම ළමා කථාව වන පෘථිවි වාසීන්ගේ අනාගතය සහ තවත් කථා ශ්‍රී ලංකාවේ ළමා සාහිත්‍යයට එකතු වන අනර්ඝ කෘතියක් ලෙස දැක්විය හැකිය. එක හුස්මට කියවිය හැකි මෙම කෘතිය මුහුණු පොතත් SMS පණිවිඩත් අතරේ අතරමංව සිටින බොහෝ දූ දරුවන් මදකට හෝ ඉන් ඉවත් කර ගනිමින් නිර්මාණාත්මක කෙටි කතා කියවීමේ මනරම් අත්දැකීම කරා යොමු කරවයි. එසේම ඔහු ඇතැම් කථා තුළින් තාක්ෂණයේ දියුණුව තිබුණු පමණින් බවක් බවක් නොමැතිව සිදුකරන අත්හදා බැලීම් නිසා ඇතිවන අනර්ථකාරී ප්‍රතිඵල පිළිබඳව ද සදියුම් අනතුරු හැඟවීමක් කරයි. දිනෙන් දින ළමුන්ගේ වියැකී යන කියවීමේ පුරුද්ද නැවත ඔවුන් වෙත ළඟා කරවීම සඳහා කරන්නාගොඩ මහතාගේ මෙම කෘතියෙහි දායකත්වය මා මහත් අගය කොට සලකන අතර තව තවත් මෙවැනි රසබර කෘති ඔහු අතින් ලියවේවා යි ඔහුට සුභ පතමි.

**ආචාර්ය ප්‍රදීපා විජේතුංග**
පුස්තකාලයාධිපතිනි,
කොළඹ විශ්ව විද්‍යාලය.


Nine Publishing
21, Murugan Place,
Colombo - 06
+94714580941
www.ninepublishing.com

ISBN: 978-624-5717-50-7

9 786245 717507

Rs. 800/-


පෘතුවි වාසීන්ගේ අනාගතය සහ තවත් කතා

ආචාර්ය නෙළුක මදුරංග කරන්නාගොඩ

# පෘතුවි වාසීන්ගේ අනාගතය සහ තවත් කතා

(විද්‍යා ප්‍රබන්ධ එකතුව)

ආචාර්ය නෙළුක මදුරංග කරන්නාගොඩ

# පෘතුවි වාසීන්ගේ අනාගතය සහ තවත් කතා

(විද්‍යා ප්‍රබන්ධ එකතුව)

**ආචාර්ය නෙළුක මදුරංග කරන්නාගොඩ**

NINE
Publishing

**පෘතුවි වාසීන්ගේ අනාගතය සහ තවත් කතා**

**© ආචාර්ය නෙළුක මදුරංග කරන්නාගොඩ**

ප්‍රථම මුද්‍රණය : **2016 පෙබරවාරි**
දෙවන සංසෝධනය : **2025 ජනවාරි**

ISBN : 978-624-5717-50-7

සෝදුපත් කියවීම **රංජිත් ලාල් කරන්නාගොඩ**
**හේමා කුරුප්පු**
**ලක්ෂ්මි හසන්තිකා කුමාරි අතුකෝරළ**

කවර නිර්මාණය : **ලසිත ෂ්‍යාම්ලාල්**

පරිගණක අකුරු සංයෝජනය : **Design & Print**

මුද්‍රණය : **Neo Graphics**
උඩහමුල්ල දුම්රියපොල පාර, ගංගොඩවිල, නුගේගොඩ.

ප්‍රකාශනය : **Nine Publishing**
**21, Murugan Place,**
**Colombo 06**
**+94714580941**
**www.ninepublishing.com**

## කර්තෘගෙන් පෙරවදනක්.....

මා විසින් රචිත ප්‍රථම කෘතිය වූ "කළමනාකරණ තොරතුරු පද්ධති" නැමැති ග්‍රන්ථය එළිදැක්වීමෙන් වසර 5ක් වැනි කෙටි කාලයක් තුළ තවත් ග්‍රන්ථයක් ශ්‍රී ලාංකික ග්‍රන්ථ කලාවට දායක කිරීමට ලැබීම මහත් භාග්‍යයක් කොට සලකමි. කළමනාකරණ තොරතුරු පද්ධති නැමැති ග්‍රන්ථය තුළින් ශ්‍රී ලාංකීය විශ්ව විද්‍යාලවල අභ්‍යන්තරික හා බාහිර කළමණාකරන උපාධි අපේක්ෂකයන් තුළ පැවති කළමනාකරණ තොරතුරු පද්ධති විෂය සඳහා වූ සිංහල ග්‍රන්ථයක අඩුපාඩුව මකා දැමීමට හැකි වූ බව මාගේ විශ්වාසයයි.

මාගේ දෙවන ග්‍රන්ථය වන මෙම කෘතිය එළිදක්වනු ලබන්නේ වයස අවුරුදු 12ත් 17ත් අතර නව යොවුන් වයසේ පාඨකයන් සඳහා වන අතර ශ්‍රී ලාංකීය ග්‍රන්ථ කලා ක්ෂේත්‍රය තුළ පවතින විද්‍යා ප්‍රබන්ධ කෘතීන්ගේ අඩු පාඩුව මග හරවාලීම අරමුණකි. ශ්‍රී ලංකාව තුළ බොහෝ විට දක්නට ඇත්තේ විද්‍යා ප්‍රබන්ධ පරිවර්තන වන අතර ස්ව නිර්මාණ දැකිය නොහැකි තරම් බව කිව යුතු ය.


මාගේ පියාගෙන් හා සීයාගෙන් ලත් ආභාසය තුළින් කුඩා කල පටන් ම පිටසක්වල ජීවීන්, තාරකා විද්‍යාව, අධිමානසික විද්‍යාව, අද්භූත සිදුවීම් වැනි විෂය ක්ෂේත්‍ර කෙරෙහි මා උනන්දුවක් දැක් වූ අතර, පසුකාලීන ව අධ්‍යාපන කටයුතු හා රැකියාව නිසා එම විෂයයන් කෙරෙහි යොමු වීමට තිබූ කාලය සීමා සහිත විය. නමුත් ඉඩක් ලත් හැම මොහොතක ම, අන්තර්ජාලය තුළින් නවීන කරුණු පරීක්ෂා කරන ලද අතර, මා සිත තුළ ජනිත වූ මනඃකල්පිත රූප රාමු පෙළ ලේඛන ගත කිරීමට, මා පෙළඹ වූ ප්‍රධාන කාරණාව වූයේ මගේ සුරතල් දියණියයි. රැකියාව, අධ්‍යයන කටයුතු හා දියණියගේ වැඩ කටයුතු අතරතුර කාර්ය බහුල වූ මා හට මාගේ බර කරට ගෙන ග්‍රන්ථය ලිවීම සඳහා

අවශ්‍ය වූ මානසික නිදහස් බව ලබා දීම වෙනුවෙන් මම මාගේ ආදරණීය බිරිඳ වන ලක්ෂ්මි ට අතිශයින් කෘතඥ වෙමි. ඇය නොවන්නට මෙම කථා පෙළ තවමත් මගේ කටු සටහන්වලට සීමා වනු නියත ය. සුරතල් සිනහව හා, දඟකාර වදන් තුළින් මගේ දියණිය තිනායා මා තුළ ඇති කරවන්නා වූ සතුට, ශක්තිය හා ප්‍රබෝධය මෙම ග්‍රන්ථය ලිවීම සඳහා මා පෙළඹ වූ ප්‍රධාන ම කරුණු වූ, අතර මෙම ග්‍රන්ථය රස විඳින සෑම පාඨකයෙකු ම ඇයට ස්තුතිවන්ත විය යුතු ය යන්න මගේ හැඟීමයි. කුඩා කල පටන් ම මෙවැනි කාර්යන් සඳහා මා නිරතුරුව ම දිරිමත් කරමින්, ශක්තිමත් කරන, මාගේ මෙතෙක් පැමිණි ගමනට පදනම සැපයූ මාගේ පියා රන්ජිත් කරන්නාගොඩ හා මව සුජාතා කරන්නාගෙ ාඩ වෙත මම මගේ ගෞරවාදරය පුදකරනු කැමැත්තෙමි. අලුත් යමක් කිරීමට සැරසෙන ඕනෑ ම මොහොතක ඒ සඳහා මා දිරි ගන්වනු ලබන මාගේ බිරිඳගේ පියාණන් වන සිරිපාල අතුකෝරළ හා මව ජයන්තා අතුකෝරළ ද මාගේ ම නැගණියන් දෙපළ වන කල්පනා හා ඩිලානි ද මෙම ග්‍රන්ථයෙහි වැදගත් කොටස්කරුවන් ලෙස ශ්‍රී ලාංකේය ග්‍රන්ථ කලා ඉතිහාසයට එකතු විය යුතු ය. මාගේ ග්‍රන්ථකරණ හැකියාවට මංපෙත් විවර කළ, දැනට අප අතරින් සමු ගෙන ඇති මාගේ ආදරණීය ආතා වන ඩී.පී. කරන්නාගොඩ, මා සෑම විට සිහිපත් කරන්නේ ඉතාමත් ගෞරවයෙනි. මා අධ්‍යාපනය ලැබූ පාසල් වූ හොරණ ශ්‍රී පාලි මහා විද්‍යාලය, තක්ෂිලා මධ්‍ය මහා විද්‍යාලය සහ, සරසවිය වූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ද මෙම ග්‍රන්ථයෙහි සදාතනික කොටස්කරුවන් බව සිහිපත් කරනු කැමැත්තෙමි. තවද මෙම ග්‍රන්ථය මුද්‍රණය කිරීම සදහා දායක වූ ඩිසයින් ඇන්ඩ් ප්‍රින්ට් ආයතනයේ සියලු දෙනාටත් සිංහල භාෂාව භාවිතය නිවැරදිව සකසාදුන් හේමා කුරුප්පු මහත්මිය හා චම්පික ගුණසේකර මහතාටත් මාගේ ස්තුතිය පුද කරනු කැමැත්තෙමි.

මෙම ග්‍රන්ථය රචනා කිරීමේ දී නව යොවුන් වයසේ ළමුන්ට ගැළපෙන අතිශය සරල භාෂාවක් යොදා ගැනීමටත්, මුද්‍රණය කිරීමේ දී දැකුම්කළු රූප රාමු පෙළක් සමග තරමක් විශාල අකුරින් මෙම ග්‍රන්ථය එළි දැක්වීමටත්, මා විසින් දැඩි උත්සාහයක් ගෙන ඇති අතර, එම උත්සාහයේ ප්‍රතිඵල පිළිබඳ තීරකයන් දයාබර පාඨක ඔබ වන බව මාගේ විශ්වාසයයි. සරල විෂය වස්තුවක් වටා සෑම කථාවක් ම ගොනු කරන ලද අතර, මනඃකල්පිත එහෙත් තාත්වික කථා තේමාවන්, විද්‍යා ප්‍රබන්ධයන් ලෙස මෙම ග්‍රන්ථය වර්ණ ගන්වා ඇත. එබැවින්, පුරා වසර 5ක පමණ කාලපරිච්ඡේදයක ප්‍රතිඵලයක් වූ මෙම ග්‍රන්ථය රසවිඳීමට ඔබ සැමට මම ආරාධනා කරමි. දියණිය තිනායා, ඔබ නිසි කාලය එළඹි විට, ඔබගේ රස වින්දනය උදෙසා මෙම ග්‍රන්ථය ඔබටම තිළිණ වනු ඇත.

# පටුන


| | පිටුව |
|---|---|
| 01. සොයා ගැනීම | 1-5 |
| 02. ඩොනල්ඩ් මහතා වෙලාගත් අද්භූත රාත්‍රිය | 7-13 |
| 03. සෙනෙත් ඇල්ෆ්‍රඩ් දුටු පෘථිවි වාසීන්ගේ අනාගතය | 15-21 |
| 04. තරඟය | 23-32 |
| 05. බර්මියුඩාවේ අභිරහස | 33-45 |
| 06. භයානක පැළෑටිය | 47-56 |
| 07. දිය යටින් කිමිද ගියෙමි | 58-67 |



## සොයා ගැනීම

මේසය මතට වී පරීක්ෂණ නලත් සමග ගතකළ කාලය දින 10ක ටත් අධික වූ අතර ඔහු නමින් තෝමස් විය. ඇමරිකාවේ ශ්‍රේෂ්ඨ විද්‍යාඥයෙකු වන මොහු, දින ගණනක් තිස්සේ පරීක්ෂණ නලත්, විවිධ බෙහෙත් වර්ගත් සමග පොරබදමින් සිටී. තෝමස්ගේ මුහුණේ මඳ සිනා රැල්ලක් ද සමග මළානික බවත් ගැබ් ව තිබේ. ඔහු සෙමෙන් පුටුවෙන් නැගිට දොර අසලට ගොස්, දොර තද කොට එය හොඳින් අගුළු ලා ඇති බව තහවුරු කොට ගෙන පැමිණ  නැවතත් තම පුටුව මත වාඩි වූයේ ය. තෝමස් දින ගණනකින් නිසි නින්දක් ලබා නැත. නිසි ආහාරයක් ද ලබා නැත. ඔහු තමා සිටින විද්‍යාගාරයේ දොර තදින් වසාගෙන තනිව ම පරීක්ෂණ පවත්වමින් සිටී. තම ගෙදර අයෙකුටවත් තම විද්‍යාගාරයට  ඇතුළු වීමට ඉඩ නොදුන් ඔහු, ඉතා බැරෑරුම් පරීක්ෂණයක් පවත්වන බව පෙනෙන්නට තිබේ.

එදින සැන්දෑ භාගය ද උදාවිය, තවමත් පරීක්ෂණ නලවල ඇති බෙහෙත් වර්ග කලවම් කරමින්, ඒවා පරිගණකය වෙත ඇතුළු කරමින් ලැබෙන වාර්තා පරීක්ෂා කිරීම ඔහු විසින් සිදුකරයි. ඔහුට එක්වර ම යමක් මතක් වූවා සේ පුටුවෙන් නැගිට දිව ගොස්, රසායනාගාර කැබිනටය විවර කර රතු පැහැති දියරයක් ගෙන තම පරීක්ෂණ නලවලට කළවම් කළේ ය. "මේ මා දරණ අවසන් උත්සාහයයි, මෙය අසාර්ථක වුවහොත් මට පිස්සු හැදේවි" යැයි පවසමින් මිශ්‍රණය සකසා පරිගණකයට ඇතුළත් කරන ලදී. තත්පර කිහිපයක් ගත විය. පරිගණක තිරය මත අදාළ ඖෂධය නිවැරදි යැයි සටහන් විය. තමා උපන් දා සිට දුටු විශ්මිතම, සුන්දර ම අකුරු පෙළ මෙය මෙන් ඔහු කෙමෙන් පරිගණක තිරය දෙස ඇසිපිය නොහෙළා බලා සිටින්නට විය. තමා සෑදූ ඖෂධය සාර්ථක වීමෙන් ලද ප්‍රීතිය ඔහුට නිම්හිම් නැත. ඔහු නිපදවූයේ කිසි දිනක කිසිවෙකු නිපදවීමට උත්සාහ නො

කළ, කිසිදා සොයා ගැනීමට නොහැකි වූ ඖෂධ වර්ගයකි. මෙම ඖෂධය මගින්, ඕනෑ ම සත්වයෙකු වෙනත් ඕනෑ ම සත්වයෙකු බවට පරිවර්තනය කළ හැකි ය. මෙය ආශ්චර්යමත් ඖෂධයක් වුවත්, සොබාදහමට පටහැනි ඖෂධයක් බැවින්, යමෙකු අහම්බෙන්වත් තම විද්‍යාගාරයට පැමිණියහොත් දකිති යි සිතූ තෝමස්, ඒවා නිදිපෙති අසුරන කුප්පියක ගබඩා කර තබා මීයෙකු සෙවීමට වෙහෙසුණේ ය. නිදිපෙතිවල හැඩයට මෙම ඖෂධ බෙහෙවින් සමාන බැවින් දැන් කිසිවෙකුට ඒවා හඳුනා ගැනීමට නොහැකි වනු ඇත.

ක්‍රමයෙන් අඳුර වැටීගෙන එන්නට වූ අතර, සුදු පැහැති මීයෙකු අල්වා ගැනීමට තෝමස්ට හැකි විය. ඔහු බෙහෙත් පෙත්ත කිරිවල මිශ්‍රකර, එයට බළලෙකු බවට පරිවර්තනය වීමට අවශ්‍ය කුඩුවලින් ස්වල්පයක් ද එකතු කොට මීයාට බීමට දුන්නේ ය. බඩගින්නේ සිටි අසරණ මීයා විසින් කඩිනමින් කිරි පිඟාන ම හිස්කර දමන ලදී. ආශ්චර්යයකි! ටිකෙන් ටික මීයාගේ ස්වරූපය වෙනස් වන්නට වූ අතර, පැය කිහිපයකට පසු තමා ඉදිරියේ දක්නට ලැබුනේ බළලෙකි. තෝමස්ට මෙය අදහාගත නො හැකි වූ අතර, තමා කළ සොයා ගැනීම ඉතා සාර්ථක බවත් අද්විතීය බවත් සිතන්නට විය. ඔහු බළලා ව දෑතට ගෙන සුරතල් කරන්නට විය. තම පරීක්ෂණාගාරයේ දොරට යමෙකු ගසන හඬත් සමග තෝමස් පියවි සිහියට පැමිණියේ ය. ඉදිරි දොරෙන් ඇතුළු වූ තමා කුලියට සිටින නිවසේ අයිතිකරු තම පරීක්ෂණාගාරයේ දොර අසලට ම පැමිණ තිබේ. තමා මෙම නිවස සඳහා මාස 6ක පමණ කුලී ගෙවා නොමැති බව ක්ෂණික ව සිහි වූ තෝමස් නිශ්ශබ්ද ව සිටීමට තීරණය කළේ ය. මක්නිසාද යත්, යම් හෙයකින් තමා පරීක්ෂණාගාරයෙන් එළියට ගියහොත් අනිවාර්යෙන් ම මහලු ගෙහිමියා ඊට ඇතුළු වනු ඇත. ඔහු තවත් දෙදෙනකු සමග පැමිණ සිටින අතර, තෝමස් ව ගෙයින් එළියට ඇද දැමීම ඔහුගේ අරමුණ බව, දොරට ගසමින් කථා කරන දෙසට කන්

යොමා සිටි තෝමස්ට වැටහිණි. සෑහෙන වේලාවක් අගුළු දමා ඇති දොර විවෘත කිරීමට උත්සාහ ගත් තිදෙනා ආයුධ සමග විත් මීළඟ දිනයේ දී එම දොර කඩා දමන බව පවසමින් එම ස්ථානයෙන් ඉවත් ව ගියෝ ය.

මීළඟට තමාගේ පරීක්ෂණය සඳහා, වෙනත් මනුෂ්‍යයෙකු යොදා ගෙන කිරීමට තීරණය කර තිබුණ ද හදිසියේ ඇති වූ තත්ත්වය මත එම තීරණය වෙනස් කොට හදිසි තීරණයකට ඔහු එළඹියේ ය. වෙනත් පුද්ගලයෙකු සොයාගෙන මෙම පරීක්‍ෂණය සිදු කිරීමට බලා සිටියහොත්, තමාට මෙම පරීක්ෂණය සිදු කිරීමට නොහැකි වෙති යි සිතූ තෝමස්, තමා ම සිය පරීක්ෂණය සඳහා භාජනය වීමට තීරණය කරන ලදී.

මේසයේ පසෙකින්, නැවත මිනිසෙකු බවට පරිවර්තනය වීමට අවශ්‍ය ඖෂධය තබන ලද ඔහු, එදින රාත්‍රියේ සිය ඖෂධයට හූනෙකු වීමට අවශ්‍ය කුඩු මිශ්‍ර කර පානය කරන ලදී. සතුන්ට මෙන්ම මිනිසාට ද මෙම ඖෂධය සාර්ථක බව ප්‍රත්‍යක්ෂ කරමින්, තෝමස් ක්‍රම ක්‍රමයෙන් හූනෙකු බවට පරිවර්තනය වීම ආරම්භ විය. ඔහු මහත් ප්‍රීතියට පත්වූ අතර, සතෙකු වීමෙන් තමාට ඇති වාසි ගැන කල්පනා කරමින්, කාමරයේ කවුළුවකින් පිටතට ගොස් තම නිවසේ බිත්ති පුරා සැරිසැරීමට පටන් ගත්තේ ය. ඉන් අනතුරුව තම නිවසින් පිටතට ගොස් අසල ඇති ගොඩනැගිල්ලකට ඇතුළු වී එහි බිත්ති පුරා සැරිසැරීමට පටන් ගත්තේ ය. එළිය වැටීමට තව විනාඩි 15 ක් පමණ තිබිය දී ඔහුට නැවත තම නිවසට පැමිණිය යුතු බවත් යළි මිනිසෙකු වීමට අවශ්‍ය බවත් සිහිපත් විය. ඔහු හැකි ඉක්මනින් තම පර්යේෂණාගාරය වෙත ගමන් කළේ ය. නමුත් ඒ වන විට ද ඔහු ප්‍රමාද ය. නිවසේ හිමිකරුත්, ඔහුගේ සගයනුත් පැමිණ රසායනාගාරයෙ දොර කඩා රසායනාගාරය පරීක්‍ෂා කරමින් සිටියෝ ය. සෑම තැන ම පරීක්ෂා කළ ඔවුන්ට කිසිවක් දකින්නට නොවූ අතර, මේසය පරීක්ෂා කිරීමේ දී එක්වරම එක් පුද්ගලයෙකුගේ අතේ වැදී නැවත මිනිසෙකු බවට පරිවර්තනය

වීමට බෙහෙත මිශ්‍ර කර සකසන ලද කිරි වීදුරුව බිම පතිත විය. සිදුවීමට යන දෙයහි ප්‍රතිඵලය ක්ෂණික ව වටහා ගත් තෝමස් බීරාන්තව වහලය මතට වී ඒ දෙස බලා සිටින්නට විය. ක්ෂණික ව බිත්තියටත් ඉන් බිමටත් පැන ගත් ඔහු බිම වැටුණු කිරි පානය කිරීමට උත්සාහ ගත්ත ද එය ඒ අසල වූ කාපට් එකට උරා ගෙන අවසන් ය. කිසිවක් සොයා ගැනීමට නොහැකි වූ නිවෙස් හිමියා හා සගයෝ කෝපයෙන් කෑ ගසමින් ඉන් පිටවී ගියේ ය.

දැන් තෝමස්ට කරගැනීමට දෙයක් නොමැත. තමා සෑදූ බෙහෙත විනාශ වීම නිසා තමාට දැන් කවරදාවත් හූනාගෙන් මනුෂ්‍යයෙකු බවට පරිවර්තනය වීමට නොහැකි බව අවබෝධ වූ තෝමස් තමා සිදු කරගත් මෝඩ ක්‍රියාව ගැන දුක් වන්නට විය. කනස්සලු සිතින් හිස හැරුණු අතේ යාමට සිතාගෙන අනෙක් පස හැරුණු විගස ම යමෙකුගේ දත්වලට තමා තදවෙනු දැනෙන්නට විය. ඔහු වේදනාවෙන් හැරී බැලුවේ ය. තම ඖෂධයෙන් පරිවර්තනය කළ බළලාගේ කටට තමා ව හසුවී ඇති බව තෝමස්ට පෙනිණ. තවත් සුළු මොහොතකින් බළලා තමා ව ගිල දමන බව ඔහුට දැන් අවබෝධ වී හමාර ය. බළලාගේ තියුණු දත් පහර සිය ගෙල වෙත වදිනවාත් සමග ම ලොවට ශ්‍රේෂ්ඨ නිර්මාණයක් සිදු කළ විද්‍යාඥ තෝමස් සඳහට ම සිය ජීවිත ගමනට සමු දුන්නේ ය.



## ඩොනල්ඩ් මහතා වෙලාගත් අද්භූත රාත්‍රිය

වෙලාව රාත්‍රී 9.00 පමණ වූ අතර ඩොනල්ඩ් මහතා යහළුවෙකුගේ රාත්‍රී සාදයකට සහභාගී වීමෙන් අනතුරුව ගෙදර බලා පැමිණෙමින් සිටියේ ය. ඩොනල්ඩ් මහතාගේ නිවස කැලිෆෝනියා ජනපදයේ පිහිටා තිබූ අතර ඔහුගේ මිතුරාගේ නිවස පිහිටා තිබුණේ ඔහුගේ නිවසේ සිට කිලෝමීටර් 170 ක් පමණ ඈතින් පිහිටි රොප්ඩේල් නම් කැළෑබද ගම්මානයේ ය. නිවස බලා ආපසු පැමිණෙන මාර්ගයේ ඔහු තවමත් පසු කර ඇත්තේ කිලෝමීටර් 50 ක් පමණ ය. ඩොනල් ගමන් කරමින් සිටියේ අති නවීන පන්නයේ ජීප් රථයකින් වූ අතර, කැළෑබද ව පවතින අවට ප්‍රදේශය දෙස බැලූ ඔහුට කෙදිනකවත් නොදනුන තරමේ පාළු ගතියක් දැනෙන්නට විය. අවට පරිසරය ඉතාමත් නිහඬ බවක් දැන වූ අතර, ඉතා තදින් සුළං හමන ආකාරයක් අවටින් දිස් විය. තමාගේ රථයේ එළිය හැරුණු විට ඔහු හට දිස්වුණු එක ම ආලෝක කදම්බය වූයේ ඈත අහසේ තැනින් තැන මතුවන විදුලි කෙටීම් ය. පෙනෙන තෙක් මානයක මිනිස් පුළුටක් දන්නට නොවූ අතර, ඔහුගේ සිත අමුතු ආකාරයේ හැඟීමකින් නොසන්සුන් විය. එය පැහැදිලි ව තේරුම් ගැනීමට අපහසු හැඟීමක් වූ අතර, එය බිය ද, නැතහොත් කාන්සිය ද යන්න කල්පනා කරමින් ඔහු රථය ඉදිරියට පදවා යන්නට විය. දැඩි කාන්සිය හේතුවෙන් ඩොනල් වාහනයේ වූ රේඩියෝව ක්‍රියාත්මක කර ගීතයකට සවන් දීම ආරම්භ කළේ ය. එහි ප්‍රචාරය වූයේ කිසිදා අසා නොමැති ඉතාමත් දුක්බර ගීතයක් වු අතර, මනස තව තවත් ඉන් කම්පනය වන බවක් දැනෙන්නට විය. "මරණයෙන් පසු ආත්ම හැම තැන ම සැරි සරයි, සැරි සරයි" ගීතයේ තේමාව විය. මේ අතර අවටින් හමන සුළඟ දැඩි වූ අතර, වර්ෂාව ද ඉතා තදින් පොළොව මත ඇද හැලෙන්නට විය. අවටින් ඇසෙන සුළං හඬ සමග මුසු වූ වර්ෂාවේ හඬ, සිය ජීප් රථයෙන් නැඟෙන ගීතයත් සමග මුසු වී ඉතාමත් භයංකර ස්වභාවයක් තමා

වටා ගොඩ නැඟෙන්නට වූ අතර, එසේ ජනනය වන බිය මඟහරවා ගැනීමට අවශ්‍ය වූයෙන්, ඔහු විසින් රේඩියෝවේ ගීතය වෙනස් කිරීමට සූසර ස්විචය කරකවන ලදී පුදුමයකි! රේඩියෝවේ සෑම තැනක ම ඇසෙන්නට වූයේ ඉහත සඳහන් කරනු ලැබූ ශෝකී ගීතයයි. ගීතයේ හඬ ස්වයංක්‍රීය ව ක්‍රමයෙන් වැඩි වන්නට වූ අතර, අවට පරිසරය සුදු පැහැති මීදුම් පටලයකින් වැසී යනු ඔහුගේ නෙත්වලට හසු විය.

හිටිහැටියේ ම ජීප් රියෙහි එන්ජිම ක්‍රියාවිරහිත විය. ඩොනල් බියෙන් හා ත්‍රාසයෙන් යුතු ව වටපිට බැලූ නමුදු කිසිවක් දක්නට නොලැබුණු අතර, ජීප් රියෙන් කුඩයක් ගෙන බිමට බැස බැලූ විට, ඔහු හට දක්නට ලැබුණේ ජීප් රියෙහි රෝදයක් මඩ වගුරක එරී තිබෙන ආකාරයයි. එක් වර ම ජීප් රියෙහි ක්‍රියාත්මක ව තිබූ බැටරිය ක්‍රියා විරහිත වූ අතර, විදුලි පහන් ද නිවී ගියේ ය. ඉක්මණින් ජීප්රිය තුළ තිබූ විදුලි පන්දම ගෙන ජීප්රියේ දොර වසා දමූ ඩොනල්, මඩ වගුර පරීක්ෂා කර ඉන් ඉවතට රථය ගැනීමට නැවත රථය තුළට නැඟීමට තැත් කිරීමේ දී, ඔහුගේ බිය දෙගුණ තෙගුණ කරමින් ඔහු හට දක්නට ලැබුණේ, තමා විසින් ජීප් රථයේ දොර වසා තිබුණේ යතුර ජීප්රිය තුළ තිබිය දී බවයි. තම ජංගම දුරකථනය වාහනය තුළ වූ අතර වාහනයේ දොර විවර කර ගැනීමට නොහැකි ව, ඩොනල් තව තවත් බිය වන්නට විය.

වැස්ස ක්‍රමයෙන් වැඩි වන්නට වූ අතර, සුළඟ භයංකාර හඬක් නංවමින් අවටින් හමා යන්නට විය. ඒ හා සමග ම, පණ ගැන්වී නැති ජීප්රියෙහි රේඩියෝව පුදුමයකට මෙන් ක්‍රියාත්මක වූ අතර, නැවතත් පෙර විකාශනය වූ ශෝකී ගීතය වාදනය වන්නට විය. ඒ අතර තමාගේ සිත යම්කිසි අද්භූත බලවේගයකින් වෙළී යන්නාක් වැනි හැඟීමක් ඇති වූ අතර, ජීප්රියේ දොර හැර ගැනීමට නොහැකි හෙයින් ඒ සඳහා උපකාරයක් ලබාගැනීමට හෝ, පහන් වන තුරු

නැවතී සිටීමට ස්ථානයක් සොයා ගැනීමට ඔහු අවට පිරික්සන්නට විය. නමුත් තමා සිටින්නේ ලඳු කැළෑ අතර වූ පාරක බවත්, පෙනෙන තෙක් මානයක ගෙයක් පැමිණෙන මාර්ගයේ දී නොදුටු බවත් සිහියට ඒම නිසා සිත බියෙන් සැලෙන්නට විය. කිරීමට කිසිදු දෙයක් නොවුණු තැන ඔහු, අසල තිබූ ගසක් යටට ගොස් කුඩය ද ඉහළා ගෙන, ගැහෙන ගතින් හා සැලෙන හදින් යුතු ව ඈත මාර්ගය දෙස නෙත් යොමා ගෙන බලා සිටින්නට විය.මෙම මාර්ගයේ පැමිණෙන වෙනත් රථයකින් උපකාරයක් ලබා ගැනීම ඔහුගේ අරමුණ විය.

එක්වර ම ඈතින් දිස්වන පන්දම් එළියක් මෙන් වූ යමක් සිය දෙනෙතට ග්‍රහණය කර ගන්නට ඔහුට හැකි විය. ටික වේලාවක් යත් ම එම ආලෝකය ක්‍රමයෙන් ළංවූ අතර ගණඳුර මැදින් පන්දමක් දල්වාගෙන කුඩයක් ද ඉහළාගෙන මිනිසෙකු පැමිණෙන බව දක්නට ලැබුණි. ඔහු කෙමෙන් කෙමෙන් තමා වෙත ළං වන්නට වූ අතර, ඔහු

"මක් වෙලාද මහත්තයෝ"

යැයි උස් හඬින් ඇසීය. ඩොනල් විසින් සිදු වූ දෙය කෙටියෙන් ඔහුට විස්තර කරන ලදී.

"මේ වෙලාවේ බාස් උන්නැහේ කෙනෙක් සොයාගන්න එකනම් කරන්න පුළුවන් දෙයක් නෙමෙයි. ඒත් හෙට උදේ නම් බාස් කෙනෙක් සොයාගන්න පුළුවන්".

"ඕනෙ නම් එතකන් අපේ ගෙදර යමු"

යැයි වයස්ගත පුද්ගලයා යෝජනා කළේ ය. බියත්, සීතලත් නිසා ඔහුගේ කීමට තමා එකඟ වූ නමුත්, මේ මහා රාත්‍රියේ මෙවන් ප්‍රදේශයක මෙම පුද්ගලයා කුමක් කරන්නේද යන්න සොයා

බැලීමට ඔහුට කල්පනා වූයේ, ඔහුත් සමග ටික දුරක් ගමන් කිරීමේ දී ය. නමුත් එවැනි ප්‍රශ්නයක් ඇසීමට මෙය අවස්ථාව නොවූ අතර, කෙසේ හෝ නොතෙමෙන තැනකට යාම ඩොනල්ගේ එක ම අරමුණ විය. එම පුද්ගලයාගේ මුළු සිරුර ම වැසෙන පරිදි ගණ ලෝම ඇඳුමක් ඇඳ සිටි අතර, ඔහු දමාගෙන සිටි පන් තොප්පිය නිසා ඔහුගේ මුහුණ ඩොනල් හට පැහැදිලි ව නොපෙනුණි. ඔහු වැඩි කතාබහක් නොමැතිව ම ලදු කැළෑව තුළට වූ කුඩා අඩිපාර දිගේ ගමන් කරන්නට වූ අතර, ඩොනල් ද ඔහු පසුපසින් ගමන් කළේ ය. එක්වර ම ඇති වුණු ආලෝකමත් විදුලි කෙටීමකින් ඔහු හට දිස් වූයේ, එම පුද්ගලයාගේ කට ඉතා පළල් බවත්, නාසය ඉතාමත් දික් වූ බවත් ය. එය ඔහුගේ මුහුණට ඉතා රෞද්‍ර පෙනුමක් ලබා දී තිබුණි.

ටික දුරක් ගමන් කළ පසු ඈතින් ගෙයක් දර්ශනය වන්නට වූ අතර, ඉහත සඳහන් කළ පුද්ගලයා ඩොනල් ද කැටුව නිවස තුළට ගොඩ විය. මෙය තමාගේ නිවස බව හෙතෙම පැවසූ අතර, ඔහුගේ කටහඬ කලින් තිබුනාට වඩා ගොරෝසු වී ඇති බවත් ඩොනල් හට අවබෝධ විය. ඔහු ඩොනල් හට කාමරයක් පෙන්වූ අතර, එයට ගොස් නිදා ගැනීමට හැකි බවත් රැය පහන් වන තුරු මෙහි ගත කළ හැකි බවත් දැන්වී ය. මෙම නිවස තුළ විදුලිය නොමැති වුව ද දල්වා ඇති ඉටිපන්දම් ආලෝකයෙන් දිස් වූයේ මෙම කාමරය ඉතාමත් සුව පහසු අලංකාර කාමරයක් බව ය. කාමරයට ඇතුළු වූ ඩොනල් දොර තදින් වසාගත් අතර මඳ වේලාවක් යත් ම පසෙකින් දැඩි දුර්ගන්ධයක් දැනෙන්නට විය. එය, මිනිස් ලේවලින් නිකුත් වන සුවඳට සමාන වූ අතර ඝණ අන්ධකාරය නිසා කිසිවක් හරි හැටි දර්ශනය නොවී ය. ඉටිපන්දම නිවා දැමූ ඔහු නිදාගන්නට සැරසෙනවාත් සමග ම යලිත් ඉටිපන්දම දැල්වීමට පටන් ගන්නා ලදී. නැවතත් ඉටිපන්දම නිවා නින්දට වැටුණු අතර, වේගයෙන් යමෙකු ඇවිදින හඬක් දොරට ඔබ්බෙන් ඇසෙන්නට විය. ඩොනල් මහතා සිය අත් ඔරලෝසුවෙන් වේලාව බැලූ විටත්, එහි රාත්‍රී දොළහ

සටහන්ව තිබූ අතර, රාත්‍රී දොළහේ ඔරලෝසු කටු නැවතී ඇති බව දක්නට ලැබිණි. බියෙන් වෙව්ලමින් සෙමෙන් දොරට ළංව දොර විවෘත කර කොරිඩෝව දෙස බැලූ ඩොනල් හයින් බිරාන්ත විය. ඔහු දුටුවේ බෙල්ල කඳින් වෙන් වූ ඉතා විරූපි මුහුණක් ඇති පුද්ගලයෙකු කොරිඩෝවේ එහා මෙහා ගමන් කරන ආකාරයකි. ඒ තමා ව මේ ගෙදරට රැගෙන පැමිණි වයස්ගත පුද්ගලයා බව මොහොතකින් ඩොනල්ට අවබෝධ විය. බියෙන් වෙව්ලන්නට වූ ඩොනල්, කාමරයේ දොර ක්ෂණික ව වසාගෙන එය අගුළු ලා ගන්නට විය. මොහොතකින් කාමරයේ තිබූ ඉටිපන්දම නැවතත් දල්වුණි. ඒ හා සමගම, විරූපී මුහුණක් ඇති හිස කඳින් වෙන් වූ, දිගු දත් හා දිගු නිය ඇති, ඇස් ලෝදිය මෙන් රතු පැහැ ගැන්වුණු පුද්ගලයෙකු, අගුළු ලා තිබූ දොර විවර කරගෙන කාමරයට ඇතුළු වන්නට විය.

ඉබේම මෙන් ඔහුගේ දෑත් සිය කලිසන් සාක්කුවට යොමු වූ අතර, ඔහුට හමුවූයේ සෑම විට ම එහි තිබෙන පිරිත් පොත ය. එය එළියට ගෙන එහි ඇති පද කිහිපයක් ඩොනල් සෙමෙන් මුමුණන්නට විය. එක්වර ම තමාගේ හිස කැරකැවෙන බව දැනෙන්නට වූ අතර, දෙනෙත් හැර බලන විට තමා සිටියේ රෝහලක ඇඳක් මත වූ අතර පසෙකින් පිරිත් පොත ද විය. හෙදියකගෙන් කෙසේ තමා මෙම ස්ථානයට පැමිණියේ දැයි විමසූ කල, ඇය කියා සිටියේ මීට දින තුනකට පෙර තමා බොන්ස්ටන් ප්‍රදේශයේ කැළෑවක වැටී සිටිය දී දුටු පුද්ගලයෙකු තමාත් ජීප්රියත් රෝහලට භාර දී ගිය බව ය. තමාට සිහිය පැමිණ ඇත්තේ දින තුනකට පසුව වූ අතර සිදු වූ සියල්ල ඡායාවක් මෙන් සිත තුළ ගමන් කරන්නට විය. ඉන්පසු සිය පියාගේ නිවසට දුරකථන ඇමතුමක් ගෙන තමා එදින ගෙදර පැමිණෙන බවත්, හදිසි රාජකාරියක් හේතුවෙන් පසුගිය, දින තුන තුළ ගෙදර පැමිණීමට නොහැකි වූ බවත් දැන්වීය. මඳක් සුව වූ පසු රෝහලෙන් නික්මුණු ඔහු විසින්, ජීප්රියේ නැගී පියාගේ නිවසටත් ඉන්පසු සිය නිවසටත් ගමන් කරන ලදී. මෙම අත්භූත සිදුවීම කිසිවෙකු සමග නොපැවසූ අතර, නිවසට පැමිණි විගස තමාගේ

දින පොතේ ඉහත සිදුවීම සටහන් කිරීම ඔහු විසින් ආරම්භ කරන ලදී. තමා සතු වූ පිරිත් පොත නිසා තමා බේරී ඇති බව හෙතෙම තදින් විශ්වාස කරන බවත් එහි අවසානයේ සටහන් කරන ලදී.

ඉහත විස්තරය ඇතුළත් දිනපොත පොළිස් පරීක්ෂණ කණ්ඩායමට හම වූයේ ඩොනල් මහතාගේ මරණය පිළිබඳ පරීක්ෂණ කිරීමට ඔහු වාසය කරන නිවසට ගිය පසුව වූ අතර, ඔහුගේ මළ සිරුරේ තැන් තැන් නිල්පැහැ ගැන්වී ඇති බව නිරීක්ෂණය විය. බොහෝ දෙනාට ඩොනල් මහතාගේ මරණය අභිරහසක් වූ අතර, පුදුම සහගත කරුණ වුයේ ඒ සම්බන්ධ ව කිසිඳු හෝඩුවාවක් නොවීම ය. මරණය සිදුවී තිබුණේ දින පොතේ තොරතුරු සටහන් කළ රාත්‍රියේ ම බව, පශ්චාත් මරණ පරීක්ෂණයෙන් අනාවරණය විය. ඩොනල් මහතාගේ මරණයත්, ඉහත සිය දින පොතෙහි සටහන් කර ඇති සිද්ධියත් අතර යම් සම්බන්ධතාවක් ඇති බව පොළිසිය විශ්වාස කළ අතර, ඩොනල් මහතා ව  රෝහලට ඇතුළු කළ පුද්ගලයා සොයා ගැනීමට පොළිසිය දැරූ සියලු ම උත්සාහයන් ව්‍යාර්ථ විය. රෝහල වෙත ඩොනල් මහතාව ඇතුළු කළ පුද්ගලයාගේ නම සුල්තාන ලෙස රෝහලේ රෙජිස්ටරයෙහි සටහන් වී තිබුණ ද, එවැනි පුද්ගලයෙකු එම ප්‍රදේශයේ වාසය කරන බවක් වාර්තාවල දක්නට නොවී ය. තව ද ඉහත විස්තරය පරිදි අදාළ ප්‍රදේශය පරික්ෂා කළ ද, එම කැළෑබද ප්‍රදේශයේ නිවසක් තියා පැලක් වත් නොමැති බවත්, මිනිසුන් වාසය නොකරන බවත් තහවුරු විය.නමුත් පරීක්ෂණ සිදු කළ පොළිස් නිලධාරීන් හට ඩොනල් මහතාගේ ඇඟිලි සළකුණු සහිත විදුලි පන්දම අදාළ ප්‍රදේශයේ ලඳු කැළෑවක් තුළ තිබී හමු වූ අතර, එහි ඩොනල් මහතාගේ රුධිරයට සමාන නොවන රුධිරය තැවරී තිබූ බව පසුව කරන ලද පරීක්ෂණවලින් අනාවරණය විය.

******************************



## සෙනෙත් ඇල්ෆ්‍රඩ් දුටු පෘථිවි වාසීන්ගේ අනාගතය

ඔහු නමින් සෙනෙත් ඇල්ෆ්‍රඩ් ය. ඇමරිකානුවෙකු වුව ද, දැනට අවුරුදු 10 ක පමණ සිට වාසය කරනුයේ ඊජිප්තුවේ නගරයක් වන කයිරෝහි ය. මෙයට හේතුව ඔහු ඊජිප්තුවේ පැරණි ශිෂ්ටාචාරය පිළිබඳ ගවේෂණයක නිරත ව සිටීම ය. මෙම ගවේෂණයේ ප්‍රධාන අරමුණ වූයේ, චියොප් පිරමීඩය තුළ ඇතැයි සැලකෙන ග්‍රන්ථයක් සොයා ගැනීම ය. මෙම ග්‍රන්ථයේ අද්භූත වස්තුවක් පිළිබඳ තොරතුරු ඇතැ යි මීට පෙර ඔහුට පුරා විද්‍යාත්මක කැණීම් අතරතුර ලැබුණු කෘතියකින් දැන සිටි අතර වසර 10 ක් ගත වී තිබුණ ද, තවමත් එම අද්භූත ග්‍රන්ථය සොයා ගැනීමේ වාසනාව ඔහුට උදා වී තිබුණේ නැත.

නමුත් සිය උත්සාහය අත් නොහළ ඔහු නැවත වරක් උත්සාහ කිරීමේ අරමුණෙන් 2066 මාර්තු මස 30 වන දිනට පහන් වත් ම හුදකලාව ම සිය ජීප් රියට නැගී චියොප් පිරමීඩය අසලට ගොස්, ජීප් රිය පසෙකින් නවතා ඒ තුළට ඇතුළු වීය. ඔහු මෙම පිරමීඩය තුළට පැමිණි 10 වෙනි වතාව මෙය විය. පිරමීඩය තුළට ඇතුළු වූ විගස ම පසු ගිය වසරේ ඔහු පැමිණීමේ දී තිබුණාට වඩා වෙනසක් ඒ තුළ තිබෙන බව දක්නට ලැබුණ ද, ඒ කුමක් දැයි හරිහැටි නිගමනය කිරීම අසීරු විය. රාත්‍රී 7.00 පමණ වන තෙක් ම දැඩි කුතුහලයෙන් යුතු ව එම වෙනස අවබෝධ කර ගැනීමට උත්සාහ දැරුව ද එය පහසු කාර්යයක් නොවී ය. නමුත් රාත්‍රී 7.30 පමණ වන විට එම වෙනස කුමක් දැයි අවබෝධ කර ගැනීමට හැකි සංඥා පහළ වෙමින් පැවතිණ. පිරමීඩය පතුලේ එක් ගලකින් ඉතාමත් සිහින් කොළ පැහැති ආලෝකයක් විහිදෙන බවත් එය ක්‍රමයෙන් වැඩි වන බවත් සෙනෙත්ට වැටහී ගියේය. මෙයින් ඉමහත් විස්මයට පත් ඔහු නිකමට මෙන් එම ස්ථානයට කිට්ටු කර සැලෙන හදින් යුතු ව එම

ස්ථානය පරීක්ෂා කිරීම සඳහා ගල් කැටය අතින් පිරිමදින්නට විය. පුදුමයකි! එක් වර ම මුළු පිරමීඩය තුළ ම තමා දල්වා තිබූ විදුලි පහන් නිවී ගිය අතර ඉතා සීත සුළඟක් මෙම ස්ථානය වෙත ගලා එන්නට විය.තමාගේ ඇඟ හිරිවැටෙන්නාක් මෙන් දැනෙන්නට වූ අතර, සිටගෙන සිටීම පවා අසීරු විය.ඒ හා සමගම පිරමීඩයේ ඈත කොණකින් පැහැදිලි කටහඬක් ඇසෙන්නට විය.

"සෙනෙත් ඔබ නම් හරිම දක්ෂයෙක්, ඒ වගේම උත්සාහවන්තයෙක්, දැන් ඉක්මනට ඔය බිත්තියේ රතු පැහැති එළියක් වැටී තිබෙන තැන අතින් අල්ලන්න."

එම වදන් රැව් පිළිරැව් දීමත් සමග ම කටහඬ අතුරුදහන් වී ගියේ ය. සෙනෙත් ගැහෙන ගතින් හා සැළෙන හදින් යුතු ව අඳුරු පිරමීඩය තුළ රතු පැහැයෙන් ආලෝකවත් වී තිබුණු තැන අතින් අල්ලනවාත් සමග ම කුඩා ගලක් විවෘත විය. ඒ තුළට එබී බැලූ ඔහුට පෙනෙන්නට වූයේ මෙතෙක් කල් තමා සෙවූ අද්භූත පොත එහි ඇති බවයි.එම ග්‍රන්ථය මහත් කුතුහලයෙන් යුතු ව අතට ගෙන දිගහැර බැලුව ද, එහි තිබෙන අකුරු මෙතෙක් තමා දැක ඇති පෞරාණික මිසර අක්ෂර හා සම නොවීම හේතුවෙන් කියවීමට නොහැකි විය. නමුත් ග්‍රන්ථය ඒ මේ අත පෙරළා බලනවාත් සමග ම පෞරාණික මිසර භාෂාවෙන් සඳහන් වූ වචන කිහිපයක් ඔහුගේ නෙත ගැටිණ.

"කොළ පැහැ ඇසින් කියවිය හැක මේ අකුරු."

මඳක් කල්පනාකාරී වු සෙනෙත් විසින් විමසිල්ලෙන් සිහින් කොළ පැහැති ආලෝකයක් නිකුත් වන ගල මතින් පොත තබන ලදී. පුදුමයකි! දැන් එහි ඇති අකුරු පැහැදිලිව කියවීමට හැකි වන පරිදි පැරණි මිසර භාෂාවට පරිවර්තනය වී ඇත.මෙය පිටු කිහිපයක් පමණක් අඩංගු කුඩා ග්‍රන්ථයක් වූ අතර සෙනෙත් විසින් ක්ෂණික ව එහි ඇති දෑ කියවීම ආරම්භ කරන ලදී.

එහි පහත පරිදි සඳහන් ව තිබුණි.

"මෙම ග්‍රන්ථයෙහි සඳහන් වන අද්භූත වස්තුව යම් පෘථිවි වාසියෙකුට ලැබුණ ද, ඉන් පලක් නොවනු ඇත. මක් නිසා ද යත් අනෙක් පුද්ගලයින් ඔහු පවසන දේ සත්‍යයක් යැයි පිළි නොගන්නා හෙයිනි. මෙම පොත වසර 2066 මාර්තු 30 දින සෙනෙත් ඇල්ෆ්‍රඩ් නම් වූ පුරා විද්‍යාඥයෙකුට හමු වනු ඇත. මෙම ග්‍රන්ථය හමු වූ තැනට දකුණින් ඇති ගලට අත තබන්න. එවිට දොරටුවක් විවෘත ව ඒ තුළ ඇති රන් වළල්ලක් ඔබට දිස්වනු ඇත."

"එය ඔබේ අතෙහි පැළඳගෙන එහි ඇති තිරය මත ඔබට අවශ්‍ය යම් වසරක් සටහන් කළ විට ඔබට එම වසර වෙත ඔබේ මනෝකාය පමණක් යැවිය හැකි වනු ඇත. නමුත් ඔබේ භෞතික ශරීරය එසේ යැවිය හැකි නොවනු ඇත."

ඉහත පරිදි සටහන් ව තිබූ වගන්ති පෙළ ඔහු ඉතා අවධානයෙන් කියවා පොතේ සඳහන් ආකාරයට වළල්ල මතුකර ගැනීමෙන් අනතුරුව එය අතට දමා ගන්නා ලදී ඉන්පසු මෙය සත්‍යයක් දැයි බැලීමට අවශ්‍ය වූයෙන්, වළල්ලේ බොත්තම් ඔබා තිරය මත 2066 මාර්තු 29 සටහන් කරන ලදී.

සිරුරේ බර ක්‍රමයෙන් අඩු වනවා සේ දැනෙන්නට වූ අතර දෑස් අන්ධකාරය තුළ ගිලී යන්නට විය. දෑස් හරින ලෙස තමාට විධානය කරන අද්භූත හඬක් ඇසුණ අතර, දෑස් ඇර බලනවාත් සමග ම තමා සිටින්නේ 2066 මාර්තු 29 දින එනම් ඊට පෙර දින නැවතී සිටි කාමරයේ ය. තමාගේ ම රූපය ඇති අයෙක් 2066 මාර්තු 30 දින වියොප් පිරමීඩය පරීක්ෂා කිරීම සඳහා යෑමට සූදානම් ව එය දින පොතෙහි සටහන් කරමින් සිටියි. මෙම වළල්ල භාවිතයෙන් තමාගේ මනෝකාය දිනක් පිටුපසට ගමන් කර ඇති බවත්, ග්‍රන්ථයෙහි ලියා තිබූ දෙය

සත්‍යයක් බවත් සෙනෙත්ට වැටහී ගියෙ ය. ඉන්පසු ඔහුට ලබන වසර, එනම් 2067 මාර්තු 30 වෙනි දින රාත්‍රියේ නිව්යෝක් නුවර සිදුවන දේ බලා ගැනීමට අවශ්‍ය විය. අද්භූත වළල්ල ක්‍රියාත්මක කොට වසරක කාලයක් ඔහු විසින් ඉදිරියට ගමන් කරන ලදී. දෑස් විවෘත කර බැලූ ඔහුට දක්නට ලැබුණේ තම මනෝකාය සිටින්නේ ඇමරිකාවේ නිව්යෝර්ක් නුවර තමාගේ කාර්යාලය ඉදිරිපිට බව ය. වේලාව රාත්‍රී 7.00 ට පමණ වූ අතර, එම වේලාවේ තමා එහි සිටිය යුතු වුවත්, තමාගේ සත්‍ය ජීවිතය එහි නොවන බව කාර්යාලය පුරා සොයා බැලීමෙන් තහවුරු විය. තමාට දක්නට ලැබුණේ තමාගේ රැකියාව වෙනත් අයෙකු විසින් සිදු කරගෙන යනු ලබන බව ය.සෙනෙත්ට මෙය මහත් ගැටලුවක් විය. එබැවින් තමාගේ ගෙදරට යාමට තීරණය කරන ලද සෙනෙත් එහි ගොස් පරීක්ෂා කිරීමේ දී පෙනී ගියේ තමා තමාගේ සත්‍ය ජීවිතයෙන් මීට මාස 11 1/2 ට පමණ පෙර සමුගෙන ඇති බව ය. එනම් සෙනෙත් ඇල්ප්‍රඩ් නැමැති ශ්‍රේෂ්ඨ විද්‍යාඥයා 2066 අප්‍රේල් 05 වන දින වියොප් පිරමීඩය තුළ දී මියගොස් ඇත. තම මනෝකාය ලද අත්දැකීම් සමුදාය ඔහුට සිතා ගැනීමට පවා නොහැකි පුදුමයට කරුණක් විය.

ඔහුට තවත් වසරක කාලයක් ඉදිරියට ගොස් තමාගේ මිත්‍රයින් නෑදෑයින් පිළිබඳ සොයා බැලීමට සිත් විය. එම අරමුණින් තවත් වසරක කාලයක් එනම් 2068 මාර්තු 30 දක්වා කාලය හරහා ඉදිරියට ගමන් කරන ලදී. තමා දෑස් විවෘත කරන විට සෑම අතින් ම වෙඩි හඬවල් ඇසෙන්න ට වූ අතර, තමා සිටින්නේ නිව්යෝක් නුවර තම කාර්යාලය අසල බවත් ඔහුට පෙනිණි. අවට කුමක් සිදු වන්නේ ද යන්න සිතාගත නොහැකි විය.අවට සැරිසරා බැලූ ඔහු හට දැක ගන්නට ලැබුණු සිද්ධීන් අතිශය විස්මය ජනක ය. ලෝකයේ ඇති සියලු ම රටවල්වලින් මේ වන විට නිව්යෝර්ක් නුවර හැරුණු විට අනෙක් සියලු ම රටවල් හා නගර වෙනත් ග්‍රහලෝකවාසීන් පිරිසක් විසින් ආක්‍රමණය කර ඇත. සියලු ම පෘථිවි වාසීන්

මරණයට පත් කර "ධූපාටා" නම් වූ ග්‍රහලෝකවාසීන් පිරිසක් පෘථිවිය ආක්‍රමණය කර තිබේ. එක් වර ම විශාල හඬක් ඇසෙනවාත් සමග ම නිව්යෝර්ක් නුවරට ඇද වැටුණු විශාල න්‍යෂ්ටික බෝම්බයකින් මුළු නුවරම සුනු විසුණු වී ගිය අතර, මුළු පෘථිවිය ම "ධූපාටා" ග්‍රහලෝකයට යටත් විය. මෙම දර්ශන පෙළ දකින එක ම පෘථිවි වාසියා තමා පමණක් බවත් හැකි ඉක්මනින් ම නැවතත් 2066 මාර්තු 30 දිනට පැමිණිය යුතු බවත් ඔහුට සිහි විය. ඔහුගේ සිත මහත් වූ භීතියකින් හා කලකිරීමකින් පිරෙන්නට විය.මක් නිසා ද යත් තවත් වසර 02 කින් සියලු පෘථිවි වාසීන් පෘථිවි තලයෙන් වඳ වී යනු ඇත. තමා මෙය දත් එක ම පුද්ගලයා වශයෙන් කුමක් කරන්නේද යන්න විසඳා ගත නොහැකි ප්‍රශ්නයක් විය.

සිය අතෙහි පැළඳි වළල්ලත්, පොතත් පිරමීඩයේ තිබූ තැන ම තැබූ ඔහු අන්ද මන්ද වූ සිතින් වියොප් පිරමීඩයෙන් එළියට විත් ජීප් රියට ගොඩ වී සිය හිතමිතුරු විද්‍යාඥයන්ට මේ බව දන්වා අනාගත උපද්‍රවයෙන් පෘථිවිය බේරාගැනීමට කටයුතු කිරීමට සිතා ගමන් ඇරඹීය. තමා දුටු පෘථිවියේ සත්‍ය අනාගතය සිය මිතුරන්ටත්, වැදගත් පුද්ගලයන්ටත් පැහැදිලි කර දුන් නමුත්, ඔවුන් ඒවා සියල්ල අවඥාවෙන් බැහැර කිරීම නිසා, අනාගතයේ පෘථිවියට සිදුවන විනාශය වැළැක්වීමට නොහැකි බව පැහැදිලි විය. ඉතා අපහසුවෙන් විද්‍යාඥයින් පිරිසක් වියෝප් පිරමීඩය වෙත කැඳවා ගෙන ගොස් විශ්මිත ග්‍රන්ථය හා වළල්ල පෙන්වා ඔවුන්ට තමා කියූ දෙයෙහි සත්‍යතාවය වටහා දීමට උත්සාහ දරන ලද අතර, එය ද පෘථිවි වාසීන්ගේ අවාසනාවට අසාර්ථක වී ගියේ ය.සෙනෙත් විද්‍යාඥයින් පිරිස එහි කැඳවාගෙන යන විට පොතත් වළල්ලත් දෙක ම අතුරුදහන් වී තිබීම ඊට හේතුව විය.

මෙලෙස අසාර්ථක වී ගිය සිය උත්සාහයන් හා නොයෙක් විද්‍යාඥයින්ගේ උසුළු විසුළු, ගැරහුම් මැද තමා

පමණක් දන්නා සත්‍යයක් බවට අනාගත පෘථිවි ආක්‍රමණය සීමා විය. සියලුම දෙනා නික්ම ගිය ද, සෙනෙත් පිරමීඩය තුළට වී බලා ගත් වන ම බලා ගෙන සිටින්නට විය. තමා සත්‍ය දුටුව ද එය කිසිවෙකුට ඒත්තු ගැන්වීමට තමාට නුපුළුවන් වීම ඔහුගේ හිතට දැඩි සංවේගයක් ගෙන දෙන්නක් විය. ක්‍රමයෙන් දින ගෙවී ගිය අතර, තමා කිසිදු ආහාරයක් නොගෙන ගත කරන 5 වන දිනය මෙය විය. දිනය 2066 අප්‍රේල් 05 වූ අතර තමා කාලය හරහා ගමන් කිරීමේ දී දුටු ආකාරයට තමා මිය යා යුතු දිනය එය විය. එය එසේ ම සිදුවන බව තහවුරු කරමින්, පෙර සළකුණු පහල වන්නට විය. මුළු ගත ම පණ නැති වී යන ආකාරයක් ඔහුට දැනෙන්නට වූ අතර මෙතෙක් සිදු වූ සියල්ල කථාවක් ආකාරයට සිය දින පොතෙහි ලීවීම හමාර කරන ලදී. අවසාන මොහොතේ ඔහු ලියා තිබූ වැකි පෙළ මෙසේ ය."මා කීවේ සත්‍යයකි, පෘථිවි වාසීන්ට තවත් ජීවත් වීමට ඇත්තේ අවුරුදු 02 ක් පමණි, දැන් මගේ ශක්තිය දුර්වල වී ඇති අතර ඇඟිලිවලින් පෑන ගිලිහී වැටෙන්නට ආසන්න ය. බුද්ධිමතෙක් වෙතොත් මෙය තේරුම් ගෙන පෘථිවිය බේරා ගැනීමට උත්සාහ ගන්න."

❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖


CHINA
asics
31

# තරඟය

රාත්‍රිය ඝණ අන්ධකාරයෙන් වැසී ගොස් ඇත. ඈත අහසේ තරුකැට දෙක තුනක් හැර කිසිවක් දක්නට නොමැති අතර, දීප්තිමත් ව දල්වෙන එක ම දෙය ලෙස දක්නට ලැබුණේ 2055 වසරේ ඔලිම්පික් ගිනිසිළුවයි. එය ඉතා හොඳින් තවමත් නිදි වර්ජිත ව සිටින සිචුවාන් හට දර්ශනය වන අතර, එදින සවස් භාගයේ සිදු වූ ඉතාමත් වැදගත් හමුවීමක මතකයන් මනසේ එහා මෙහා ගමන් කරන්නට විය. උදාවන්නා වූ පසු දින තමාට පමණක් නොව, මුළු මහත් චීන ජාතියට ම ඉතා වැදගත් දිනයක් වන අතර, බොහෝ දෙනෙක් නිදි වර්ජිත ව මීළඟ දිනය බලාපොරොත්තුවෙන් රැය පහන් කරනු ඇති බව නොඅනුමාන ය.

2055 ඔලිම්පික් ක්‍රීඩා උළෙලේ අවසාන දිනය මීළඟ දිනට යෙදී තිබෙන අතර, එහි අවසාන තරග ඉසව්ව වන මීටර් 100 තරගය උදෑසන 9.15 ට පැවැත්වීමට මේ වන විටත් සියලු කටයුතු සූදානම් කර හමාර ය. ඔලිම්පික් ඉතිහාසයේ ප්‍රථම වතාවට චීන ජනරජය හා ඇමරිකා එක්සත් ජනපදය රන් පදක්කම් සටහනේ සම තැන් ගෙන ඇති අතර, මීටර් 100 තරගයේ ප්‍රතිඵලය මත චීනය හෝ ඇමරිකාව සමස්ත ඔලිම්පික් ශූරතාවය දිනා ගනිමින් තම රටෙහි ප්‍රෞඪත්වය විදහා පානු ඇත. ආර්ථික වර්ධනය හා අනිකුත් සෑම ක්ෂේත්‍රයකින් ම චීන ජනරජය ඇමරිකා එක්සත් ජනපදය අභිබවමින් පසුවන කාල පරිච්ඡේදයක, ඔලිම්පික් ජයග්‍රහණය චීනය වෙත ලැබීම චීන ජනතාවගේ එක ම බලාපොරොත්තුව වී ඇත.

එදින සවස සත්කාරක රට වන ඇමරිකා එක්සත් ජනපදය බලා චීන ජනාධිපති ලී කූ වාන් ද පැමිණි අතර, මීළඟ දින පැවැත්වීමට නියමිත තරගය කාගේත් දැඩි අවධානයට ලක් වී

ඇති බවට ජනාධිපතිතුමාගේ පැමිණීම සාක්ෂි දරනු ඇත. තමා කැඳවූ චීන ජනාධිපතිතුමන් පැවසූ වදන්, තම මනසේ රැව් පිළි රැව් දී ඇසෙන්නාක් මෙන් සිවුවාන්ට දැනෙන්නට විය.

"පුතා, ඔබ තමා අපගේ එක ම බලාපොරොත්තුව, හෙට දිනයේ චීන ජනරජයේ ගෞරවය රැකගැනීමේ වගකීම ඔබ සතු වන අතර, මුළු මහත් චීන ජනතාවගේ ම එක ම බලාපොරොත්තුව ඔබ වනු ඇත."

පුහුණු තරග හා මේ තාක් පැවති තරග කාල ගත් කල වාර්තා කර ඇති හොඳ ම කාලයන් අතරින් ඇමරිකාව නියෝජනය කරන මාරියෝ ද සුප්‍රෝ වාර්තා කර ඇති කාලය තත්පර 8.450 කි. නමුත් තමා වාර්තා කර ඇති හොඳ ම කාලය වන්නේ තත්පර 8.451 කි. එය සුප්‍රෝගේ ධාවන කාලයට සාපේක්ෂ ව මිලි තත්පර 1 ක වැඩි කාලයකි. නමුත් කෙසේ හෝ ඇමරිකාවේ මාරියෝ ද සුප්‍රෝ පරාජය කළ යුතු ව ඇත. චීන ජනාධිපතිතුමා පැවසූ වදන් මනසේ අතුරුදහන් වත් ම බියකරු ස්වරූපයක් මුහුණට ආරෝපණය වෙමින් රාත්‍රී 8.30 වන විට තම වෛද්‍යවරයා සමග පැවති සාකච්ඡාව සිය මතකයට ගලා එන්නට විය.

"ඔබ සිටින්නේ මිලි තත්පර 1 ක් පසුපසින්. ඔබට ඔබේ වේගය මිලි තත්පර 2 කින් ඉහළ දමාගත හැකිනම්, හෙට දිනයේ ඔබ සියලු ම චීන ජනතාවගේ එක ම වීරයා මෙන් ම ගැලවුම්කරු වනු නියත ය. මීට ඇති එක් විසඳුමක් මා සතු ය." එසේ පවසමින් වෛද්‍යවරයා තමා අත සාමාන්‍ය උත්තේජක පෙති සමග විශේෂ වූ පෙති දෙකක් ද තැබීය.

"මෙම පෙති දෙක තරගයට විනාඩි 15කට පෙර පානය කරන්න. එය ඔබේ රුධිර ධාවනය අසාමාන්‍ය ලෙස වැඩිකර ඔබට

ශක්තිය ලබාදෙනු ඇත. නමුත් මෙම උත්තේජකය තවමත් මිනිසුන් සඳහා පානය කිරීමට සුදුසු ලෙස වැඩි දියුණු කර නොමැති අතර තරගය අවසානයේ ඔබේ මරණය නියත වශයෙන් සිදු වනු ඇත. එම නිසා සමස්ත චීන ජනතාව ම වෙනුවෙන් මෙම උත්තේජක පෙති පානය කිරීම හෝ නොකිරීම ඔබ විසින් තීරණය කරන්න."

තමා බොහෝ කලකින් තම සිඟිති පුතු හා සිය බිරිඳ දැක නොතිබුණ ද හෙට තරගය ඔවුන් කොහේ සිට හෝ නරඹනු ඇති බවට සිහිපත් වූ අතර, තමා හා බිරිඳ වෙන් වී දැනට වසරක් පමණ ගත වී තිබෙන බව ද ඔහුට සිහිපත් විය. තවමත් තමන් තම බිරිඳට හා කුඩා පුතුට පණ මෙන් ආදරය කරන බවත්, ක්‍රීඩාව සඳහා ම යෙදීම නිසා තමා අතින් බොහෝ අඩු පාඩු ඔවුන් දෙදෙනා වෙත සිදු වූ බවත්, පැවසීමට අවශ්‍ය වුව ද, ඒ සඳහා දැන් අවස්ථාවක් උදා නොවනු ඇත. ඊට හේතුව සමස්ත චීන ජනරජය වෙනුවෙන් අදාළ උත්තේජක පෙති දෙක පානය කිරීමට දැනටමත් තමන් තීරණය කර ඇති බැවිනි. කෙමෙන් කෙමෙන් පසු දා හිරු පායා එන්නට වූ අතර නින්දෙන් අවදි වූ සිවුවාන් තම කාමරයේ ජනේලයෙන් පිටත බැලීය. එය ඉතා මනරම් දර්ශනයකි. සමස්ත ක්‍රීඩාංගනය ම අතුරු සිදුරු නැති ව පිරී ගොස් ඇති අතර, සෑම තැනකම රතු පැහැති චීන ධජ මෙන් ම නිල් පැහැති ඇමරිකානු ධජ ද ලෙළදෙමින් ඇත. ආරාධිත අමුත්තන්ගේ අසුන් සඳහා තව ස්වල්ප මොහොතකින් ඇමරිකානු ජනාධිපති මෙන් ම චීන ජනාධිපති ද සැපත් වනු ඇත. මීට අමතර ව ලොව විවිධ රටවල්වලින් එම රටවල් නියෝජනය කරමින් ප්‍රධාන පුරවැසියන් මෙම ස්ථානයට සැපත් වනු ඇත. තම ක්‍රීඩා බෑගයට ඇඳුම් දමාගත් සිවුවාන් ක්‍රීඩා පිටියට තම පුහුණුකරු ද සමග සෙමෙන් ප්‍රවේශ වන්නට විය. පුහුණුකරු විසින් පිටුපසින් පැමිණ සාමාන්‍ය උත්තේජක පෙති සමග ඉහත විශේෂ උත්තේජක පෙති දෙක ද තමා අත තබනු ලැබී ය.

"ඉලන්දාරියා, මම ඔබ ගත් තීරණයට සදා ගරු කරනවා. අද ඔබ මිය යන්නේ චීන ජනතාවගේ සදාතනික වීරයා බවට පත් වෙමින්. ඔබ හා මා අවුරුදු 22 ක් ආශ්‍රය කර තිබෙනවා."

එසේ කියමින් තම අත වූ ලේන්සුවෙන් සිය දෑස්වලින් රූරා වැටෙන කඳුළු පිසදමා ගත් ඔහු එම ස්ථානයෙන් ඉවත් වන්නට විය.

"පුතා, ඔබ මේ සියල්ල කරන්නේ චීන ජනතාවගේ ජයග්‍රහණය වෙනුවෙන්. අප පළමුව රට ඔසවා තැබිය යුතුයි. ඒ සඳහා ඔබ මේ කරන කැපකිරීම ඔබත් මාත් හැර වෙන කිසිවෙකු නොදත් නමුත් ඔබ චීන ජනතාවගේ සදාතනික වීරයෙකු වීම කිසිවෙකුට වැළැක්විය නොහැකියි. ඔබට ජය වේවා!"

එම ස්ථානයෙන් ඔහු ඉවත්ව ගිය අතර, සියලු ම උත්තේජක පෙති අතට ගත් සිචුවාන් විසින් ඒවා තම කලිසමේ සාක්කුව වෙත යොමු කරන ලදී. තරගය පටන් ගැනීමට ඇත්තේ තවත් විනාඩි 20 ක් පමණ ය. එක්වර ම පිට්ටනියේ ඈත කෙළවරකින් තමාට සුපුරුදු දසුනක් දිස් විය. ඒ තම බිරිඳ හා කුඩා පුතු යි. තමා ඔවුන් දෙදෙනා දුටුවේ වසරකට වඩා වැඩි කලකට පසුව ය. ඔවුන් දෙදෙනා දකිනවාත් සමග ම පෙර මතකයන් සිය මනස තුළ සක්මන් කරන්නට විය. ඉතා සතුටින් ඔවුන් සමගින් ගත කළ කාලයත්, ඔවුන් සමග යම් යම් ප්‍රශ්න ඇති වූ කාලයත්, වරින් වර මනස තුළ දෝලනය වන්නට විය. සිචුවාන් ළඟට කුඩා පුතුද සමග පැමිණි බිරිඳ තමන් අතින් සිදු වූ අඩුපාඩුවලට කණගාටු වන බවත්, මෙවැනි කීර්තියක් තම රටට ගෙන ඒම වෙනුවෙන් සිදු කළ සියලු කැපකිරීම් අගය කරන බවත්, තමා සමග නැවත එක්වීමට කැමති බවත් පැවසූහ. එය සිචුවාන් ට අදහාගත නොහැකි වදන් පෙළක් විය. නමුත් තමාට ජීවත් වීමට ඇත්තේ තවත් පැය 1/2 කටත් වඩා අඩු කාලයක් බව දන්නේ තමාත්, තම වෛද්‍යවරයා හා පුහුණුකරුත් පමණි.

තවත් ස්වල්ප මොහොතකින් තමා චීන ජනතාවගේ වීරයෙකු සේ මියයන බව ඔහුට පසක් විය. තම කුඩා පුතු සහ බිරිඳට මේ බව තේරුම් කර දීමට දැන් කාලයක් නැත. තම මාතෘ භූමිය වෙනුවෙන් දිවි පිදීමට තමා තීරණය කර අවසන් ය. මෙම රහස කිසි දිනෙක හෙළි නොවනු ඇත. තම බිරිඳ හා කුඩා පුතු සිපගත් සිචුවාන් විසින් තම සිත දැඩි කර ගන්නා ලදී. එක්වර ම සාක්කුවෙන් උත්තේජක පෙති ටික ගෙන සිය මුවට හලා ගත් ඔහු කඩිනමින් ඒවා ගිල දමා තරගයට සූදානම් විය. මද වේලාවක් යත් ම තමාගේ ඇඟට අමුතුම ප්‍රබෝධයක් ලැබී ඇති බවක් දැනෙන්නට වූ අතර, තම කුඩා පුතුගේ හා බිරිඳගේ සිනහවන් සහ ඔවුන්ගේ මතකයන් මනස තුළ ගමන් කරනු ඔහුට දැනෙන්නට විය. තරගය ආරම්භ වීමට සංඥාව නාද විය. සියලු ම දෙනා පිට්ටනියේ ධාවන පථය වෙත ඇදෙන්නට වූ අතර, සියලු ම දෙනාගේ දෑස් යොමු වී ඇත්තේ තමාට හා ඇමරිකානු ක්‍රීඩක සුප්‍රෝට බව රහසක් නොවී ය. ළා හිරු කිරණ ධාවන පථය මත පතිත ව ඉතා චමත්කාර ජනක දසුන් පෙළක් මවනු ලැබී ය. සිත ඒකාග්‍ර කර ගත් සිචුවාන් තරගයට සූදානම් විය. මෙය ඔහුගේ ජීවිතයේ සදා අමරණීය දිනයක් වූ අතර, මෙවැනි තරගයක අවසන් තරගය සඳහා සමස්ත රට වෙනුවෙන් පෙනී සිටීමට ලත් අවස්ථාව තමාට අමතක කළ නොහැකි ය. තරගය ආරම්භ වීමට ඇත්තේ තවත් විනාඩියකටත් වඩා අඩු කාලයකි. මුළු පිට්ටනිය ම දැඩි නිහඬතාවයකින් වෙළෙන්නට විය. ඇමරිකාව හා චීනයේ ප්‍රෞඪත්වය තවත් විනාඩි කිහිපයක් තුළ තීරණය වනු ඇත. අනුක්‍රමයෙන් ගණන් කිරීම ආරම්භ විය. දහය.. නවය.. අට.. හත.. හය... තරගය ආරම්භ වීමට තවත් තත්පර පහක් ඉතිරි ව ඇත. පහ.. හතර.. තුන.. දෙක... තරගය ආරම්භ කිරීම සඳහා පිස්තෝලය නාද විය. තරගය ආරම්භ වූ අතර සියලු දෙනා ඉදිරියට ඇදෙන සුප්‍රෝ සහ සිචුවාන් දෙස ඇසිපිය නොහෙළා බලා සිටින්නට වූහ. තරගය ඉතාමත් උද්වේගකර වූ අතර, කවුරුන් ජයග්‍රහණය කරන්නේ ද යන්න කාටත් ප්‍රහේලිකාවක් කරමින් කරට කර තරගයක් ඔවුන් දෙදෙනා විසින් මේ වන විටත්

ලබා දෙමින් තිබිණ. ඉතා තියුණු තරගයකින් පසු තරගය නිමා විය. ප්‍රතිඵල පහත පරිදි දිස් විය.

චීන ක්‍රීඩක සිචුවාන් ගතකළ කාලය - තත්පර 8.449 යි

ඇමරිකානු ක්‍රීඩක සුප්‍රෝ ගතකළ කාලය - තත්පර 8.450 යි

මිලි තත්පර 1 කින් සිචුවාන් පළමු තැනට පැමිණ ඇත. සමස්ත ක්‍රීඩාංගනය ම ජයග්‍රහණයේ සතුටින් ඇළලී යන්නට වූ අතර, මුළු මහත් චීන ජනතාව ම සිචුවාන් වීරයෙකු ලෙස වැළඳ ගන්නට විය. තරගය අවසන් කළ සිචුවාන් තම මරණය අභියස මරණය අපේක්ෂාවෙන් පසුවන්නට විය. තම කුඩා පුතු, බිරිඳ, චීන ජනාධිපති, තම පුහුණුකරු දිව විත් තමා වැලඳගෙන තමාගේ ජයග්‍රහණය වෙනුවෙන් සුභ පතන්නට වූහ. නමුත් සිචුවාන් සිටියේ දැඩි කණස්සල්ලෙන් සහ භීතියෙන් යුතුව ය. මන්ද, තමන් ලබාගත් උත්තේජක පෙති නිසා අනිවාර්යයෙන් ම තරගය අවසන් වී සුළු මොහොතකින් තමාගේ මරණය සිදු විය යුතු නිසා ය. නමුත් ක්‍රමක්‍රමයෙන් කාලය ගත වී ගිය අතර, සිචුවාන්ගේ වෛද්‍යවරයා හා පුහුණුකරු පුදුමයට පත් කරවමින් සිචුවාන් හට කිසිඳු හානියක් නොවන ලකුණු පහළ වන්නට විය. මෙය සියලු දෙනාට ම අදහාගත නොහැකි සතුට, කණස්සල්ල මිශ්‍ර වූ හැඟීමකින් සිත් පුරවාලන්නට විය. තම විවේකාගාරය වෙත ක්‍රමක්‍රමයෙන් තම වෛද්‍යවරයා ද සමග පියනගන්නට වූ සිචුවාන් තවමත් මරණය බලාපොරොත්තුවෙන් සිටී. නමුත් තමාට තවමත් කිසිදු අපහසුතාවයක් ඇඟට නොමැති බවත්, කිසිඳු වෙනසක් නොදනෙන බවත් ඔහු වෛද්‍යවරයා සමග පැවසූ අතර, මෙය අදහා ගැනීමට නොහැකි සිදුවීමක් බව වෛද්‍යවරයා විසින් පවසන ලදී. තවත් පැය භාගයක් පමණ ගත වූ අතර, තමන් දැන් සිටින්නේ අවදානම් කාලයෙන් බැහැර ව බව

සිය වෛදවරයා පවසන්නට විය. සිචුවාන්ටත්, වෛද්‍යවරයාටත් මෙය ඉතාමත් පුදුම සහගත කරුණක් විය. මේ අතර තම බිරිඳ හා කුඩා පුතු තමා සමග නැවත වාසය කිරීමට පැමිණෙන බව සිහි වූ ඔහු ඒ සඳහා තමාට වාසනාවක් නොලැබීම ගැන කණගාටු වන්නට විය. නමුත් ක්‍රම ක්‍රමයෙන් ඔහුගේ බලාපොරොත්තු දල්වමින් කිසිදු අපහසුතාවයක් ඔහුගේ ශරීරයට දැනෙන්නට නොවී ය. ක්‍රමක්‍රමයෙන් අවදානමෙන් ඈත් වූ ඔහු කඳුළු පිසදමමින් තම විවේකාගාරය තුළ රැඳී සිටින්නට විය. ඒ හා සමග ම ක්ෂණිකව තම විවේකාගාරය තුළට දිව ආ පුද්ගලයෙක් විය. ඒ කිසිවෙකු නොව ඔහුගේ කුඩා පුතු, හර්මියන් ය.

"තාත්තේ, ඇයි ඔයා අඬන්නේ ?"

කියමින් හර්මියන් සිය කාමරයට ඇතුළු විය. කාමරයේ දොර ළඟට වී සිටින සිය බිරිඳගේ මුහුණ ද සිචුවාන්ට දකින්නට ලැබුණිහර්මියන් තවදුරටත් මෙසේ විමසන්නට විය.

"තාත්තේ, අපිත් එක්ක ගෙදර යන්න ඔයා එනවා නේද ?"

මෙසේ කියමින් ඔහු සිචුවාන් ළඟ දුවටෙන්නට විය. නමුත් ඒ සඳහා තමන් කැමති බවට පිළිතුරු දීමට අවශ්‍ය වුවත්, ඒ සඳහා නිශ්චිත පිළිතුරත් දීමට තවමත් සිචුවාන්ට නොහැකි විය. මක් නිසා ද යත් තවමත් ඔහු සිටින්නේ මරණය බලාපොරොත්තුවෙන් බැවිනි. සිචුවාන්ගේ තත්ත්වය වටහා ගත් සිය වෛද්‍යවරයාගේ දෙනෙතට පවා කඳුළු නැගෙන්නට විය. සිය කුඩා පුතු දිගින් දිගට ම ඇවිට්ලි කරමින් සිචුවාන් වටා දුවටෙන්නට විය. හදිස්සියේ ම කුඩා පුතු සිචුවාන්ගේ කලිසම් සාක්කුව වෙත අත යවමින් එය අවුස්සන්නට විය.

"තාත්තේ ඔයාගේ කලිසම් සාක්කුවේ තියෙන්නේ ටොෆි ද ?" මටත් එකක් දෙන්න"

යැයි පවසමින් හර්මියන් විසින් කලිසම් සාක්කුව ඉවතට ඇදීම ආරම්භ කරන ලදී. ඒ හා සමගම සිදු වූයේ සියලු දෙනාම බලාපොරොත්තු නොවූ සිදුවීමකි. කලිසම් සාක්කුවේ තිබුණු බෙහෙත් පෙති සියල්ල එළියට වැටුණු අතර, වෛද්‍යවරයා විසින් සිචුවාන්ට පානය කිරීමට ලබා දුන් අලුත් උත්තේජක පෙති දෙක ද දක්නට විය. සිචුවාන් පුදුමයට පත් වෙමින් බිම වැටී තිබුණු බෙහෙත් පෙති දෙස නෙත් යොමන්නට වූ අතර, වෛද්‍යවරයා ද ඒ දෙස බලා සිටිනු ඔහුට දිස් විය. තමා තරගයට පෙර පානය කරන ලද උත්තේජක පෙති අතර අදාළ විශේෂ උත්තේජක පෙති දෙක තිබුණි ද, එම පෙති පානය කිරීමේ දී එම විශේෂ උත්තේජක පෙති දෙක පානය කිරීම දෛවයේ වාසනාවකට මෙන් තමාට මගහැරී තිබුණි. මෙය වෛද්‍යවරයාටත්, සිචුවාන්ටත් අදහාගත නොහැකි කරුණක් විය. එසේ නම් තමාගේ අවම කාලය වූ තත්පර 8.451 තමා කෙසේ තවත් අඩුකර ගත්තේ ද? එය කිසි දිනෙක සිදු විය හැකි සිදුවීමක් නොවන බව වෛද්‍යවරයාත්, සිචුවානුත් හොඳින් ම දන්නා කරුණකි. තත්පර 8.451 යනු සිචුවාන්ගේ ශාරීරික ගටක අනුව ගත් කළ වාර්තා කළ හැකි අවම කාලයයි. එය ඉක්මවා යාමට නම්, කිසියම් පුදුම සහගත සිදුවීමක් සිදුවිය යුතු ය. එසේ නොමැති නම් වෛද්‍ය විද්‍යාව අනුව, කෙසේවත් එම වේගය ඉක්මවා යාම ඔහුට කළ හැකි දෙයක් නොවන බව ඔවුන් දන්නා පැහැදිලි කරුණකි. නමුත් කෙසේ හෝ සිචුවාන් තමාගේ අවම කාලය තවත් තත්පරයෙන් දාහෙන් පංගු 2කින් අඩුකර ගනිමින් තරගය ජයග්‍රහණය කර හමාර ය. එසේ නම් තමන්ගේ වේගය අසාමාන්‍ය ලෙස වැඩි වීමට බල පෑ කාරණාව කුමක් ද ? වෛද්‍යවරයාගේත්, සිචුවාන්ගේත් සිත තුළ මෙම කාරණා නැවත නැවතත් දෝංකාර දෙන්නට විය. දැන් සියල්ල විසඳී ඇත. තමාට තමා හා බිරිඳ සමග ගෙදර යාමට කිසිදු බාධාවක් නොමැති අතර, මරණය තමා වෙත ළඟා නොවනු ඇත. ඔහු එකවර ම තමන් ඔවුන් සමග ගෙදර යාමට පැමිණෙන බවට පිළිතුරු දුන් අතර, ඒ හා සමග ම තමා

ජාත්‍යන්තර මළල ක්‍රීඩා පිටියෙන් සමුගන්නා බව මාධ්‍යය වෙත දැන්වී ය. ඔහුගේ මනස තුළ ප්‍රශ්නාර්ථයක් ඇති කරමින් සිතුවිලි සක්මන් කරන්නට විය. එනම් තමාගේ වේගය අසාමාන්‍ය ලෙස වැඩි වීමට බල පෑ සත්‍යය කාරණාව කුමක් ද යන්නයි. සිවුවාන්ගේ වේගය වැඩි වීමට බලපෑ සැබෑ කාරණාව කුමක් ද ? ආදරය, සතුට, සෙනෙහස පිරුණු ලෝකය තුළ තමන් ලත් අසාමාන්‍ය සතුට, එනම් සිය බිරිඳ සහ සිය පුතු කාලයකට පසුව දකීමත්, ඔවුන් සියලු වැරදි අමතක කොට තමාට ඔවුන් සමඟ නැවත එක්වන ලෙස ආරාධනා කිරීමත් මීට බල පෑ කාරණාව විය හැකි ද? කිසිවෙකුට මෙම ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුරු දිය හැකි නොවනු ඇත. නමුත් මෙවැනි දෑ කිසි දිනක වෛද්‍ය විද්‍යාත්මක ව සනාථ නොවනු ඇති අතර, එය ඉදිරි අනාගතයේ දී විසඳුම් සොයා ගත යුතු මනෝ විද්‍යාත්මක කරුණක් වනු ඇත.

❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖



# බර්මියුඩාවේ අභිරහස

ලොව සිටින ප්‍රධාන පෙළේ තාරකා විද්‍යාඥයෙකු වන මහාචාර්ය ඇන්ඩ්‍රෝ ස්මිත්, මෙම ස්ථානයට පැමිණ අදට ගතවන 10 වන දිනය මෙය විය. ඔහු පැමිණ සිටින්නේ ලෝකයේ ම ඉතාමත් අභිරහස් ප්‍රදේශයක් ලෙස සැලකෙන, වර්තමානය වන විටත් නොවිසඳුණු ගැටලු රැසක් ඉතිරි කර තබා ඇති, ජලයෙන් පිරුණු භූමි භාගයක් වන බර්මියුඩා ත්‍රිකෝණයට යි. මෙම ප්‍රදේශය කුමක් ද යන්න, ඇමරිකාවේ කෙනඩි තුඩුවත්, බහාමාස් දූපතුත්, බර්මියුඩාවත් යා කරමින් ත්‍රිකෝණාකාර ප්‍රදේශයක් ඇඳීමෙන් ඕනෑ ම අයෙකුට දැක බලා ගැනීමට හැකිවනු ඇත. දහඅට වෙනි ශතවර්ෂයේ සිට මෙම ප්‍රදේශය තුළ අතුරුදහන් වූ යානා හා යාත්‍රා සංඛ්‍යාව බොහෝමයක් වුවත් මේ දක්වා එම යානා හා යාත්‍රාවලට කුමක් සිදුවී ද යන්න තවමත් අභිරහසකි. මේ හේතුව නිසා මෙම ප්‍රදේශය මතින් ගමන් කිරීම 19 වෙනි ශතවර්ෂයේ මැද භාගය වන විට නාවික යාත්‍රා විසින් අතහැර දමන ලදී.

කෙසේ හෝ, මහාචාර්ය ඇන්ඩ්‍රෝගේ අරමුණ වනුයේ, මෙම බර්මියුඩාවේ අභිරහස විසඳා ගැනීම වන අතර එම අරමුණෙන් ඔහු මෙම ස්ථානයට පැමිණ තිබේ. ගැඹුරු මුහුදට තම පරීක්ෂණ යාත්‍රාව ද සමග පැමිණ ගත වන 10 වන දිනය උදාවත් ම, සිය පරීක්ෂණ කටයුතු ඔහු විසින් ආරම්භ කරන ලදී. මෙතෙක් බර්මියුඩාව සම්බන්ධයෙන් සිදු කළ සියුම් පරීක්ෂණ ඇසුරින් මහාචාර්ය ඇන්ඩ්‍රෝ, සිදු වූ අතුරුදහන් වීම් සහ දිනයන් අතර යම් සම්බන්ධතාවයක් ගොඩ නගා ගෙන තිබිණ. ඔහුගේ අදාළ සූත්‍රයට අනුව මෙම ස්ථානයේ මීළඟ අතුරුදහන් වීමට අදාළ පසුබිම 2045 සැප්තැම්බර් මස 29 වනදින උදෑසන 4.00 ත් 6.00 ත් අතර කාලය තුළ සිදු විය යුතු ය. දිනය 2045 සැප්තැම්බර් 28 වූ අතර, අදාළ වේලාව

අපේක්ෂාවෙන් ඇන්ඩ්‍රෝ බලා සිටින්නට විය. ඒ අනුව එදින රාත්‍රිය නිදි වර්ජිත ව පහන් කිරීමට ඇන්ඩ්‍රෝ විසින් තීරණය කරන ලදී. ගණඳුර ක්‍රමයෙන් අවට පරිසරය වෙලා ගන්නට වූ අතර, සඳ රැස් සාගර ජලය මත පතිත ව අමුතු ම චමත්කාරයක් මවන්නට සමත් විය. මහාචාර්යවරයා ඒ දෙස ඉතා ආසාවෙන් බලා සිටි අතර, තම පරීක්ෂණයේ ප්‍රතිඵල අපේක්ෂාවෙන් තම අතැති අත් ඔරලෝසුව දෙස වරින් වර බලන්නට විය.

වේලාව රාත්‍රී 11.30ට පමණ වූ අතර, සිය ගණනය කිරීම් අනුව අදාළ අවස්ථාව උදාවීමට තවත් ඇත්තේ පැය 5 කටත් අඩු කාලයකි. මහාචාර්යවරයා විසින් නැවතත් මුහුදු පතුල නිරීක්ෂණය කිරීම ආරම්භ කරන ලදී. තවමත් කිසිදු වෙනස්කමක සලකුණක් හෝ එහි දක්නට නොවූ අතර, මහාචාර්යවරයා විසින් වඩ වඩාත් සුපරික්ෂාකාරී ව මුහුදු පතුල නිරීක්ෂණය කරන්නට විය. තවත් ස්වල්ප මොහොතක් ගත වත් ම සිය රේඩාර් යන්ත්‍රය මත මුහුදු තරංගවල කිසියම් වෙනසක් දිස් වන්නට වූ අතර, අදාළ වෙනස්කම් සිය සටහන් පොත මත සටහන් කරගත් ඔහු නැවතත් අත් ඔරලෝසුව දෙස බැලී ය. වේලාව රාත්‍රී 12.30 ලෙස එහි සටහන් වී තිබිණ. ක්‍රමක්‍රමයෙන් වේලාව ගතවන්නට වූ අතර, මඳ වේලාවක් යත් ම මුහුදු තරංගවල වෙනස්කම් වැඩි වන්නට විය. මහාචාර්ය ඇන්ඩ්‍රෝ සතුටින් පිනා ගිය අතර, සිය සොයා ගැනීම සාර්ථක වන අයුරක් පෙනෙන්නට විය. මීළඟට කුමක් සිදුවන්නේ දැයි සිය සිත කුතුහලයෙන් පිරෙන්නට වූ අතර, අදාළ ස්ථානයේ සිටි මුහුදු ජීවීන් ක්‍රමයෙන් එම ස්ථානයෙන් ඉවත්වන බවක් දක්නට විය. ඇන්ඩ්‍රෝ තැති ගැන්මෙන් හා කුතුහලයෙන් යුතු ව මුහුදු පතුල තව තවත් නිරීක්ෂණය කරන්නට විය. සිදුවන සෑම දෙයක් ම සිය දුරකථනයෙහි වූ ඉලෙක්ට්‍රොනික සටහන් පොතෙහි සටහන් කිරීම ආරම්භ කරන ලද අතර, මසුන් ඉවත් වීමත් සමග ම ඉතා සිහින් කහ පැහැති ආලෝක ධාරාවක් එම ස්ථානයේ මුහුදු පතුල හරහා ගමන් කරනු දක්නට ලැබුණි.

එම ආලෝක ධාරාව ක්‍රමයෙන් ඈතට පැතිරී යත් ම ඊට වඩා තද පැහැයෙන් යුතු තවත් කහ පැහැති ආලෝක ධාරාවක් මුහුදු පතුල හරහා ගමන් කරන්නට විය. මහාචාර්යවරයා එක්වර ම තම යාත්‍රාවේ ඇති ඔරලෝසුව දෙස බැලී ය. වේලාව පෙ.ව. 3.45ට පමණ වූ අතර, සිය ගණනය කිරීම් අනුව තවත් විනාඩි 30ක කාලයක් තුළ, තමාට මෙම ස්ථානයේ සත්‍ය වශයෙන් ම සිදු වන්නේ කුමක් දැයි දැක බලා ගැනීමට හැකි වනු ඇති, බව ඔහු විසින් අවබෝධ කර ගන්නා ලදී. ඔහු තව තවත් මුහුදු පතුල නිරීක්ෂණය කරන්නට විය. සියලු ම මුහුදු ජීවීන් එම ස්ථානයෙන් ඉවත් වන්නට වූ අතර, අදාළ වේලාව ක්‍රමයෙන් ළං වත් ම මුහුදු පතුල හරහා ගමන් කරන ආලෝක ධාරාව තද කහ පැහැයේ සිට අඳුරු පැහැයට පරිවර්තනය වන්නට විය. මහාචාර්ය ඇන්ඩ්‍රෝ වඩාත් විමසිලිමත් වූ අතර, එක වර ම මුහුදු පතුල විවර වන බවක් දක්නට ලැබිණ. මෙය තමන් දකින දෘෂ්ටි මායාවක් ද, නැතිනම් සත්‍ය සිදු වීමක් ද යන්න අදහා ගැනීමට නොහැක ව මුහුදු පතුල දෙස ඇසි පිය නොහෙලා බලා සිටින්නට විය.

ඇන්ඩ්‍රෝ නැවතත් සිය අත් ඔරලෝසුව දෙස බැලී ය. පුදුමයකි! එහි කටු නොනවත්වා කැරකෙන ආකාරයත් ඔහුට දක්නට ලැබුණි. ඒ හා සමග ම ඇන්ඩ්‍රෝ සිය සාක්කුවේ ඇති කුඩා දුරකථනය ගෙන එහි වේලාව බැලී ය. පුදුමයකි! එහි ද වේලාව නොනවත්වා ගමන් කරන අතර, දිනය, මාසය හා වර්ෂය ද නොනවත්වා ඉදිරියට ගමන් කරනු ඔහුට දක්නට ලැබුණි. එකවර ම සිය යාත්‍රාව භ්‍රමණය වන්නට වූ අතර, එය මුහුදු ජලය ද සමග මුහුදු පතුලට ඇදී යන්නට විය. මුහුදු පතුල තව තවත් විවර වූ අතර, ඒ තුළින් දක්නට ලැබුණේ ඉතා අඳුරු පැහැයකි. ආලෝකය, ජලය සියල්ල ම එම අඳුරු දොරටුව වෙත ඇද ගන්නට වූ අතර, ඇන්ඩ්‍රෝ සමග යාත්‍රාව ද භ්‍රමණය වෙමින් ඒ දෙසට ඇදී යන්නට විය. නැවතත් සිය දුරකථනය දෙස බැලූ ඔහුට දක්නට ලැබුණේ දුරකථනයේ සටහන් ව ඇති දිනය වසර 3045 බවය. එය

වසර දහසක ඉදිරි දිනයක් වූ අතර, කුමක් සිදු වන්නේ ද යන්න වටහා ගැනීමට නොහැකි විය. වේගයෙන් භ්‍රමණය වන්නට වූ යාත්‍රාව තව තවත් වේගය වැඩි වෙමින් භ්‍රමණය වන්නට විය. ඒ හා සමග ම චුම්බක ක්ෂේත්‍රයෙහි විශාල වෙනසක් සිදුවන බවත්, දිශාවක් සොයාගත නොහැකි ලෙස මාලිමා යන්ත්‍රය භ්‍රමණය වන බවත් මහාචාර්ය ඇන්ඩ්‍රෝ හට දක්නට ලැබිණ. සිය යාත්‍රාව අඳුරු දොරටුව වෙත වේගයෙන් ඇදී යන්නට වූ අතර, එක වර ම සිය දෙනෙත් පියවෙන බවක් දැනෙන්නට විය. මඳ වේලාවක් ගත වූ අතර, ක්‍රමක්‍රමයෙන් ඇන්ඩ්‍රෝ පියවි සිහියට නැවත පත්වන්නට විය. මුහුද ඉතාමත් නිසොල්මන් වී ඇති අතර, යාත්‍රාව කිසිදු හානියක් නොවී මුහුදේ පාවෙමින් පැවතිණ. ක්ෂණික ව සිය සාක්කුවෙන් ජංගම දුරකථන ඉවතට ගත් ඇන්ඩ්‍රෝ එහි නැවතී ඇති දිනය දැකීමෙන් පුදුමයට පත් විය. එහි සටහන් වූ දිනය වූයේ වර්ෂ 5045 සැප්තැම්බර් 29 ලෙස ය. සිය ජංගම දුරකථනයේ දිනය කෙසේ මෙලෙස වෙනස් වූයේ දැයි සිතමින්, සිදු වූයේ කුමක් දැයි දැන ගැනීම සඳහා පරිගණකයේ වූ ගූගල් සෙවුම් යන්ත්‍රය ඔහු විසින් විවෘත කරන ලදී.

"අන්තර්ජාල සම්බන්ධතාව නොමැත." යන වැකිය

එහි දිස්විය. කුමක් සිදු වූයේ ද යන්න වටහා ගැනීමට අසීරු වූ අතර, අවට බැලීමට යාත්‍රාවේ තට්ටුව මතට ඒමට ඇන්ඩ්‍රෝ විසින් තීරණය කරන ලදී. යාත්‍රාවේ තට්ටුව මතට පැමිණි මහාචාර්යවරයාට සිය දෙනෙත් අදහා ගැනීමට නොහැකි විය. අහස දෙස බැලූ ඔහුට දකින්නට ලැබුණේ කහ පැහැති වලාකුළුවලින් පිරී ඇති චන්ද්‍රයන් 10 ක් පමණ ඇති අභ්‍යවකාශයකි. සෑම තැනක ම තරු කැට විසිරී තිබූ අතර, එක් චන්ද්‍රයෙකු වෙනුවට චන්ද්‍රයින් 10 දෙනෙකු අහසෙහි දකින්නට විය. සිය දුරදක්නය ගෙන ඈත බලන්නට වූ මහාචාර්යවරයාට තමා පෙර දින දුටු කිසිදු ගොඩනැගිල්ලක් හෝ දක්නට නොවී ය. ඒ වෙනුවට ගෝලාකාර විශාල වස්තූන්

රසක් ඇතින් දක්නට විය. කුමක් සිදු වී ඇත්ද යන්න තවමත් දැඩි ප්‍රහේලිකාවක් වූ අතර, වෙරළ දෙසට යාත්‍රාව පදවාගෙන යාමට ඇන්ඩ්‍රෝ විසින් තීරණය කරන ලදී. ක්‍රමයෙන් වෙරළ වෙත ළං වූ ඔහු, සිය යාත්‍රාවෙන් එළියට පැමිණි අතර දැඩි පිපාසයක් දැනෙන්නට විය මුහුණ කට සෝදා ගැනීමට මුහුදු ජලයෙන් දෝතක් ගෙන එය මුවට හලා ගත් ඇන්ඩ්‍රෝ පුදුමයෙන් ඇලළී ගියේ ය. මුහුදු ජලයේ ලවණ රස වෙනුවට ඉතා ප්‍රනීත රසක් දැනෙන්නට විය. එම රසය කිසිදා අත්විඳ නැති රසයක් බව වැටහීමට මහාචාර්යවරයාට වැඩි වේලාවක් ගත නොවී ය. තමන් පෘථිවියෙන් වෙනත් කුමන හෝ ස්ථානයකට ගමන් කර ඇති බව ඔහුට වැටහී ගිය අතර, එක වර ම ඈතින් තමන් දෙසට පැමිණෙන අමුතු ම ආකාරයේ වස්තුවක් ඔහුට දිස්විය. තරමක් විශාල කහ පැහැති ගෝලයක් රෝල් වෙමින් අහසේ පාවෙමින් පැමිණ තමන් ඉදිරියේ නැවතුනි. එක් වර ම එහි දොරක් විවර වූ අතර, ඉන් අමුතු ම ආකාරයේ පුද්ගලයන් කිහිප දෙනෙක් එළියට පැමිණියෝ ය. මීටර් 3ක් පමණ උස් වූ එම පුද්ගලයන්ගේ ඇස්, පෘථිවියෙහි මිනිසුන්ගේ කණ් පිහිටා ඇති තැන, පිහිටා තිබූ අතර කණ් වැනි යමක් ඔළුව පිටුපසට වන්නට පිහිටා තිබෙනු දක්නට විය.

එක අතක ඇඟිලි 10 ක් පමණ වූ අතර, දෙපය ම වැසෙන සේ යමක් හැඳ සිටි බවක් දක්නට ලැබී ය. ක්‍රමයෙන් ළඟට එත් ම එක් අයෙකුට පාද 3 ක් ඇති බවත්, ඔහුට ඕනෑ ම දිශාවකට ඉනෙන් කැරකිය හැකි බවත් පැහැදිලි විය. ක්‍රමයෙන් තමා ළඟට පැමිණි එක් පුද්ගලයෙකු කුඩා උපකරණයක් ඇන්ඩ්‍රෝ අත තැබී ය. එය කණට දමා ගන්නා ලෙස අතින් සංඥා කරන බවක් දක්නට ලැබුණු අතර, ඇන්ඩ්‍රෝ මහතා විසින් අදාළ උපකරණය කණෙහි පැළඳ ගන්නා ලදී. එය භාෂා පරිවර්තක උපකරණයක් බව මද වේලාවකින් ඇන්ඩ්‍රෝ හට අවබෝධ විය.

"මම මේ කොහෙද සිටින්නේ ?"

ඇන්ඩ්‍රෝ විමසී ය.
"ඔබ සිටින්නේ සියුටස් ග්‍රහලෝකයෙයි. ඔබව සාදරයෙන් සියුටස් ග්‍රහ ලෝකය වෙත පිළිගන්නවා."

පිළිතුර විය.

"සියුටස් ග්‍රහලෝකය ? මම කවදාවත් අසා නෑ. එය කොහෙද තියෙන්නේ ?"

"අපේ ග්‍රලෝකය පිහිටා තිබෙන්නේ ඇන්ඩ්‍රෝමීඩා චක්‍රාවාටයේ දකුණු අර්ධයට වන්නටයි. පෘථිවියෙන් ආලෝක වර්ෂ 40,000 ක් ඈතිනුයි අපේ ග්‍රහලෝකය පිහිටා තිබෙන්නේ."

ඇන්ඩ්‍රෝ මහතාට මහත් කුතුහලයක් මෙන් ම පුදුමයක් දැනෙන්නට විය. තම පෘථිවි වාසීන් කිසි දිනක දැක නොමැති පිටසක්වල ජීවීහු තමන් ඉදිරියේ සිටිති. තමන් පිටසක්වල ජීවීන් සොයා ගත් ප්‍රථම විද්‍යාඥයා ය. නමුත් මෙය කෙසේ සිදු වී ද? සිදු වූ සියල්ල චිත්‍රපටයක රූපරාමු පෙළක් මෙන් මනස තුළ ගමන් කරන්නට විය. මෙය මහත් පුදුමයකි. තමන් ආලෝක වර්ෂ 40,000 ක් ඈතින් ඇති ග්‍රහලෝකයක් වෙත ක්ෂණික ව පැමිණ ඇත.

"මම මෙහාට ආවේ කොහොම ද ?"

"ඔබට ඒ ගැන පැහැදිලි කර ගැනීමට අවශ්‍ය නම් මහාචාර්ය ස්වස්තා හමු වීමට යමු. ඔහු ඔබව කැඳවා ගෙන එන ලෙස අපට දැනුම් දුන්නා. ඔහු තමයි අපේ ග්‍රහලෝකයේ වෙසෙන ඉතිරි වූ එක ම තාරකා විද්‍යාඥයා."

ඔවුන් පැමිණි ගෝලාකාර වස්තුව තුළට ගොඩවන ලෙස ඇන්ඩ්‍රෝට දනුම් දුන් අතර, ඇන්ඩ්‍රෝ එම වස්තුව වෙත සෙමෙන් ගොඩ විය. එය ඉතා අරුම පුදුම වස්තුවක් වූ අතර, ඇතුළත වක්‍රාකාර ව ආසන 6 ක් විය. එකිනෙකට මුහුණලා එම අසුන් පිහිටා තිබූ අතර, පැමිණි තිදෙනා ද සමග මහාචාර්ය ඇන්ඩ්‍රෝ විසින් අසුන් ගන්නා ලදී. විවිධ ආකාරයේ ආලෝක බුබුළු එහි වූ අතර, එක්වර ම මදක් එසවුණු යානය වේගයෙන් ගමන් කරන්නට විය. විනාඩි 5 ක පමණ ගමනකින් පසු, එය එක්තරා ගෝලාකාර ගොඩනැගිල්ලක් ඉදිරියේ නතර විය. තමන් ක්ෂණික ව කොපමණ දුරක් පැමිණියේ දැයි ඇන්ඩ්‍රෝ විසින් විමසන ලදී.

"අපි දන් පැමිණ සිටින්නේ මහාචාර්ය ස්වස්තාගේ පර්යේෂණාගාරයටයි."

එය තිබෙන්නේ සිය ග්‍රහලෝකය ආසන්නයේ පිහිටා තිබෙන චන්ද්‍රයෙකුගේ බවත්, විනාඩි 5 ක් තුළ කිලෝ මීටර් 100,000 ක් තමන් ගමන් කර ඇති බවත්, ඔවුන් විසින් ඇන්ඩ්‍රෝ හට පවසන ලදී.

අදාළ යානයෙන් බිමට බැස ගත් ඇන්ඩ්‍රෝ සහ එහි ගමන් කළ තිදෙනා මහාචාර්ය ස්වස්තා වෙත ගමන් කරන්නට වූහ. එම ගොඩනැගිල්ල ගෝලාකාර වූ අතර, බිම ස්පර්ශ නොවන ලෙස අහසේ පාවෙමින් පැවතිණ. එයට ඇතුළු වත් ම ඇන්ඩ්‍රෝ හට දක්නට ලැබුණේ විශාල තිර මත දිස්වන විවිධ සතුන්ගේ රූපරාමු පෙළකි. එම කිසිදු සතෙකු මීට පෙර පෘථිවිය මත දක නොතිබුණු අතර, ඔහු ඒවා නරඹමින් ඉදිරියට ඇදෙන්නට විය. එකවර ම තමා ඉදිරියට පැමිණියේ අඩි 20 ක් පමණ උස පුද්ගලයෙකි.

"සුබ උදෑසනක් වේවා! මම මහාචාර්ය ස්වස්තා පාර්කින්සන්."

"එසේම වේවා! මම මහාචාර්ය ඇන්ඩ්‍රෝ ස්මිත්."

"ආ එහෙනම් ඔබත් මහාචාර්යවරයෙක්. ඔබ මොනවා පිළිබඳ මහාචාර්යවරයෙක්ද ?"

"මගේ ප්‍රියතම විෂය තාරකා විද්‍යාවයි."

"හමුවීම සතුටක් මහාචාර්ය ඇන්ඩ්‍රෝ."

මෙම පුද්ගලයා කරුණාවන්ත ස්වභාවයක් පළ කළ අතර, වයස අවුරුදු 55ක පමණ පෙනුමක් ඔහු වෙතින් දිස් විය. පෙර පුද්ගලයන්ගේ පරිදි ම පාද තුනක් ඔහුටත් තිබූ අතර, ඉතා සුහදශීලී ව ඔහු විසින් කථා කිරීම ආරම්භ කරන ලදී.

"ඔබට මහන්සිත් ඇති. අපි මොනවා හරි කන ගමන් කථා කරමු."

එසේ කියමින් ඇන්ඩ්‍රෝ ද සමග කුඩා මේසයක් වෙත ගිය ඔහු එහි වාඩි වන ලෙස දැන්වීය. එම මේසය ත්‍රිකෝණාකාර වූ අතර, සෑම තැනකම විවිධ ආලෝක බුබුළු දල්වෙන්නට විය. මහාචාර්ය ස්වස්තා එහි එක් බොත්තමක් තද කළ සැණින් ගෝලාකාර පිඟන් මෙන් යම් දෙයක් එකවර ම මේසය තුළින් ඉහළට මතු විය. එක් බඳුනක් ඇන්ඩ්‍රෝ හට ලබා දුන් ඔහු එහි ඇති දෙය ආහාරයට ගන්තේය. ලෙස දැන්වී ය. ඒ තුළ වූ ආහාර වර්ගය කිසි දිනෙක දැක නොතිබූ අතර, හැන්දකින් ටිකක් ගෙන ආහාරයට ගන්නා ලදී. ඉතා ප්‍රණීත රසක් දැනෙන්නට වූ අතර, එය ඇළෙන සුළු ආහාරයක් විය. ආහාර ගන්නා අතරතුර පෘථිවිය සම්බන්ධ බොහෝ දේ ස්වස්තා මහතාට පැහැදිලි කළ අතර, තමා කෙසේ මෙහි පැමිණියේ ද යන්න ඇන්ඩ්‍රෝගේ ප්‍රධාන ප්‍රශ්නය විය.

අපි මීට ටික කලකට පෙර වෙනත් ග්‍රලෝකයකට යාමට තාරකා දොරටුවක් විවෘත කර ගැනීමට උත්සාහ කළා. අපි විවිධ සංඛ්‍යාත ඔස්සේ පරීක්ෂණ සිදු කළා. ඒ අතරේ එක්තරා සංඛ්‍යාතයක දී පෘථිවියට යාමට හැකි තාරකා දොරටුවක් විවෘත කර ගැනීමට අපට හැකි වුණා. නමුත්, මෙහි සිට පෘථිවියට යාමට හෝ පෘථිවියේ සිට මෙහි පැමිණීමට හැකි පැහැදිලි ක්‍රමයක් සොයා ගැනීමට අපට හැකි වුණේ නෑ. නමුත් සිදු කළ සමහර උත්සාහයන්වල දී පෘථිවියේ සිට අපේ ග්‍රහලෝකයට පෘථිවියේ එම තාරකා දොරටුව තිබූ ස්ථානයේ යම් යම් දේ පැමිණුණා. නමුත්, පණ පිටින් පැමිණි එක ම පුද්ගලයා ඔබයි. අනෙක් සෑම අයෙක් ම පැමිණෙන විට මිය ගොස් සිටියා. අපි ටිකෙන් ටික මෙම තාරකා දොරටුව හරහා ගමන් කිරීමේ හැකියාව වැඩි දියුණු කළා. එසේ කරමින් සිටිය දී තමයි ඔබගේ ලොව ජීවීන් ඔය කියන විධියට පෘථිවියේ එම ස්ථානය හරහා ගමන් කිරීම නතර කරලා තියෙන්නෙ. එම නිසා පසුව කළ පරීක්ෂණවල දී පෘථිවියෙන් කිසිවකු අප වෙත ගෙන්වා ගැනීමට හැකි වුණේ නැහැ. ඒ අතරතුර තමයි අපේ ග්‍රහලොවට විශාල උල්කාපාතයක් කඩා වැටුණේ. එම අනතුරින් අපේ ග්‍රහලොවේ සිටි බුද්ධිමත් ජනයාගෙන් 99% ක්ම විනාශ වුණා. බේරුණු අය, අසල පිහිටි චන්ද්‍රයන් වෙත ආවා. කාලයක් ම මේ පරීක්ෂණය සිදු කිරීම නතර වුණා. නමුත් සෑම විට ම අපගේ පරීක්ෂණ කාල සටහන අනුව අදාළ වේලාවන්වලදී අපේ ග්‍රහලෝකයට ගොස් එම තාරකා දොරටුව විවෘත කිරීමට උත්සාහ කළා. කාලයකට පසුව ඊයේ තමයි එය නැවතත් සාර්ථක වුණේ. එම අවස්ථාවේ දී ඔබත් හරියට ම එම ස්ථානයේ සිටියා. එහෙම තමයි ඔබ මෙහාට ආවේ. අපේ පර්යේෂණවලට අනුව සෑම ග්‍රහලොවක ම එක් ස්ථානයක තාරකා දොරටුවක් තිබෙනවා. එම ස්ථානයේ චුම්බක ක්ෂේත්‍රය වෙනස් කිරීමෙන් ඒ හරහා එක් එක් ග්‍රහලෝක වෙත ගමන් කළ හැකියි. එවිට ඔබ ඒ තුළින් ගමන් කරන්නේ ආලෝකයේ වේගයටත් වඩා වැඩි වේගයකින්. එම නිසා ආලෝක වර්ෂ දස දහස් ගණනක්

ක්ෂණික ව ගමන් කරන අතර, වයස යෑම සිදු වන්නේ නැහැ. නමුත් ඒ තුළින් නිශ්චිත ග්‍රහලොවක් වෙත කෙසේ ගමන් කළ හැකි දැයි තව ම අප සොයා ගෙන නැහැ. පෘථිවියට අදාළ තාරකා දොරටුව විවෘත කිරීමේ චුම්බක ක්ෂේත්‍රය පමණක් අපි සොයා ගත්තා.

"එය ද සොයා ගත්තේ අහම්බෙන්."

මහාචාර්ය ස්වස්තා පැවසී ය. මේ සියල්ල සිහිනයකින් මෙන් මහාචාර්ය ඇන්ඩ්‍රෝ අසා සිටින්නට විය.

"ඒ කියන්නේ පෘථිවියේ සිට මෙහාට ආවත්, නැවත පෘථිවියට යන ක්‍රමයක් ඔබ සොයාගෙන නැද්ද?"

ඇන්ඩ්‍රෝ විමසී ය.

"තවම නැහැ".

ඔහුගේ පිළිතුර විය.

"හැබැයි එහෙම සොයා ගත්තත් දැන් ප්‍රතිඵලයක් නැහැ. මොකද හෙට සිට අපගේ මේ පරීක්ෂණය නතර කිරීමට සිදු වෙනවා."

මහත් විමතියෙන් ඔහු කියන දෙය දෙස සවන් යොමා සිටි ඇන්ඩ්‍රෝගේ සිතෙහි දහසක් ප්‍රශ්න මතුවන්නට විය.

"මෙතරම් දේ සාර්ථක ව සොයා ගෙනත් ඇයි හෙට සිට පරීක්ෂණ නවත්වන්නේ ?"

ඇන්ඩ්‍රෝ තම සිතෙහි තෙරපෙමින් පැවති ප්‍රශ්නය ඇසී ය.

"හ්ම්......................"

"ඔබ දන්නවා ද ? මේ පෘථිවියේ කුමන වර්ෂය ද කියා ?"

"2045 වර්ෂයනේ." ඇන්ඩ්‍රෝ පැවසීය.

"නැහැ. මේ පෘථිවියේ 5045 වර්ෂය. ඔබ වසර 3000 ක් අභ්‍යවකාශය හරහා ගමන් කර තිබෙනවා. පෘථිවිය මතට විශාල උල්කාවක් වැටුණේ වසර 5000 දී යි. එනම් මීට වසර 45 කට පෙරයි. ඉන් පෘථිවියේ ජීවීන් සම්පූර්ණයෙන් විනාශ වී ගියා. නමුත් අද වන තෙක් පෘථිවි ගෝලය පැවතියා. නමුත් මීට ටික වේලාවකට පෙර එහි ගැටුණු අති විශාල වල්ගා තරුවක් නිසා පෘථිවි ගෝලය මුළුමණින් ම කුඩු වී ගියා. දැන් ඔබගේ සෞරග්‍රහ මණ්ඩලයේ අඟහරු හා සිකුරු අතර ඇත්තේ හිස් අවකාශයක් පමණයි."

ඔහු පවසන දෙය අදහා ගත නොහැකි ව ඇන්ඩ්‍රෝ බලා සිටින්නට විය. තමා පිටසක්වල ජීවීන් හා බර්මියුඩාව පිළිබඳ අභිරහස විසඳුව ද, දැන් ඉන් පලක් නැත. තවදුරටත් පෘථිවිය කියා ග්‍රහලොවක් නොමැති අතර, තම පරීක්ෂණ ප්‍රතිඵල කාට පවසන්නේ ද?

ඒත් සමග ම මහාචාර්ය ස්වස්තා පෘථිවියේ විනාශ වී යාම කෙසේ සිදු වී දැයි සිය පරිගණකය මත පෙන්වන්නට විය. ඉන් පසු දුරදක්නයක් ගෙන පෘථිවිය තිබූ ස්ථානයේ දැන් තිබෙන්නේ හිස් අවකාශයක් බව මහාචාර්ය ඇන්ඩ්‍රෝ හට පෙන්වා දෙන ලදී. සියල්ල හීනයක් මෙන් විය. නැවත කිසිදා පෘථිවිය නම් වූ සුන්දර ග්‍රහලොව මෙම විශ්වය තුළ දැකිය හැකි නොවනු ඇත.

දුරදක්නය තුළින් හිස් අවකාශය දෙස බලා සිටි ඇන්ඩ්‍රෝගේ නෙතට කඳුලක් නැඟෙන්නට විය. කුමක් ද මේ පෘථිවියට සිදු වුණේ. පෘථිවි වැසියන් පෘථිවිය විනාශ වී යාමට

පෙර වෙනත් ග්‍රහලොවක් වෙත ගියා ද ? නැතිනම් සියල්ලන් ම විනාශ වුණා ද ? දහසකුත් ප්‍රශ්න ඇන්ඩ්‍රෝගේ සිත තුළ වූ අතර, දෑස් කඳුළින් තෙත් වන්නට විය. ඉතා ලයාන්විත ව ඇන්ඩ්‍රෝගේ කර වටා අතක් දැමූ මහාචාර්ය ස්වස්තා මෙසේ පැවසී ය.

"ඇන්ඩ්‍රෝ සියලු දෙය ම නැසෙන සුළුයි. අනිත්‍යයි. දුක් නොවන්න. ඉතිරි කාලය ඔබ මෙහි ගත කරන්න."

කඳුලු අතරින් ඉහළ බැලූ ඇන්ඩ්‍රෝට කෙළින් ම මහාචාර්ය ස්වස්තාගේ මුහුණ දිස්විය. ඔහු මද සිනහවකින් යුතුව තමා දෙස බලා සිටි අතර, තම දෙසවනට හුරු බුදු දහමේ එන එම වදන් පෙළ ඔහු කෙලෙස ඉගෙන ගන්නා ලද්දේ දැයි ඇසීමට අවශ්‍ය වුවත් ඇන්ඩ්‍රෝට තම පපුව තුළින් දැඩි වේදනාවක් හට ගන්නා බව දැනෙන්නට විය.

"මං හිතන්නේ මට සියලු දෙයම හැර යාමට කාලය ඇවිත්. සෑම දෙයක් ම පැහැදිලි කර දුන්නාට ඔබට ස්තුතියි."

එසේ පවසමින්, ඇති වූ තදබල හෘදයාබාධයක් නිසා මහාචාර්ය ඇන්ඩ්‍රෝ සදහට ම දෙනෙත් පියා ගත්තේ ය. පෘථිවියේ අවසන් ජීවියා වන ඇන්ඩ්‍රෝ විසින් වසර 5045 සැප්තැම්බර් 30 වන දින සදහට ම විශ්වයෙන් සමු ගන්නා ලදී.



## භයානක පැළෑටිය

මහාචාර්ය සෙල්ඩ්‍රින් ඇමරිකා එක්සත් ජනපදයේ විශිෂ්ට විද්‍යාඥයෙකු වූ අතර ඔහු පරීක්ෂණ නල එහා මෙහා කරමින් එකිනෙකට යම්කිසි දියරයක් වත් කරමින් තම විද්‍යාගාරය තුළ පරීක්ෂණයක මූලික පියවර පිරික්සමින් සිටී.

සෙල්ඩ්‍රින් එතරම් වයස්ගත නොවූව ද ඔහුගේ මුහුණ වටා වැවී ඇති සණ රැවුල, පළල් වූ නළල් තලය, නිතර පැලදි උපැස් යුවල, පටි සහිත කමිසය හා නිතර දෙතොල් අතර රැඳෙන දුම් පයිප්පය ඔහු තුළින් විද්‍යාමාන කරවන්නේ තලතුනා බවක් හා බුද්ධිමත් බවකි. පරීක්ෂණාගාරයට එකවර ම පැමිණියේ තම සුරතල් පුතු වූ ඇලෙක්ස් ය. ඔහු අවුරුදු 8 ක පමණ දඟකාර කුඩා දරුවෙකි. දිවගෙන පැමිණ මේසය යටින් රිංගා ඉතා සීරුවට තමා දෙසට පැමිණි කුඩා පුතු ව අල්ලා වඩා ගත් ඔහු විසින් පුතු සුරතල් කර පසෙකින් තබන ලදී. ඉන් පසු ශීතකරණය විවෘත කර චොකලට් එකක් අතට ගත් සෙල්ඩ්‍රින් සිය පුතු අත චොකලට් පෙත්ත තබමින් මෙසේ පැවසී ය.

"දැන් ගිහිං සෙල්ලම් කරන්න"

ඉතා සුරතල් ලෙස චොකලට් පෙත්ත අතට ගත් ඇලෙක්ස් එය විද්‍යාගාරය තුළදී ම කඩා කා ඉන් පිට විය. තමන් කෙතරම් සුන්දර ජීවිතයක් ගත කරන්නේ දැයි සෙල්ඩ්‍රින් තමාට ම කියා ගත් අතර, නැවතත් පොතක් ගෙන එය පෙරලමින් තම පර්යේෂණයට අවශ්‍ය තොරතුරු රැස් කරන්නට විය. තම පරීක්ෂණාගාරයේ ඇති එක ම ජනේලය තුළින් දුටු දර්ශනය ඉතා ප්‍රිය ජනක විය. සුදු පැහැති සමනළයින් බිමට ඇදෙන්නාක් මෙන්, බිමට පතිත වන හිම කැට ඉතා චමත්කාර ජනක දසුනක්

මැව්වේ ය. එකවර ම තම නිවස ඉදිරිපිට මෝටර් රථයක් නවත්වන හඬ ඇසුණු අතර, ඉක්මණින් දොර අසලට ගොස් දොර විවෘත කර බැලූ සෙල්ඩ්‍රින්ට දක්නට ලැබුණේ ඉතාම වටිනා කැබ් රියකින් බැස පැමිණෙන තරුණයෙකි. ඔහු කළු පැහැති කණ්ණාඩි යුවලක් දමා ටයි පටියක් ද පැලඳ සිටි අතර වයස අවුරුදු 30 ක් පමණ වූ පෙනුමක් ඔහු වෙතින් දිස් විය.

"ඔබ තුමාට ද සෙල්ඩ්‍රින් මහාචාර්යතුමා කියන්නේ ?"

"ඔව්. මම තමා. ඔබ කවුද ?"

"මම ප්‍රොයිඩ්."

"එන්න ඇවිත් ඇතුළෙන් වාඩි වෙන්න."

"බොහොම ස්තුතියි.මම ආවේ පොඩි වැඩක් කරවා ගන්නයි."

"මොකක්ද ?"

සෙල්ඩ්‍රින් විසින් දුම් පයිප්පය කටේ ගසා ගනිමින් පෙරළා ඔහුගෙ න් අසන ලදී.

"මට අවශ්‍යයි පොඩි රහසිගත දෙයක් ඔබ ලවා සාදා ගන්න."

"මොකක් ද ? ඉක්මනින් කියන තරමට හොඳයි.මම පරීක්ෂණයක් කරමින් සිටියේ"
ඉක්මනින්?

"මම කියන්නම්. මට අවශ්‍යයි ඉතාමත් රහසිගත විධියට නිෂ්පාදනය කරන ලද රසායනික විෂ වර්ගයක්."

"ඒ මොකටද ?"

"ඒක ඔබට දැන ගැනීමට අවශ්‍ය නෑ" ඔබ විෂ සහිත ඇපල් ගෙඩියක් නිපදවන්න ඕනෙ. හැබැයි එය ගහක් මතම ම ස්වභාවික ලෙස එල දැරිය යුතුයි. කොහොම පරික්ෂා කළත් එම ඇපල් ගෙඩිය ස්වභාවිකව ම නිර්මාණය වූවක් බව පෙනෙන්නට තිබිය යුතු යි. මේ සඳහා ඔබට අවශ්‍ය ඕනෑ ම මුදලක් දෙන්න මම සූදානම්. අප මේ කතා කරන දෙය ඔබෙන් පිට වුණොත් ඔබට ඉතා ඉක්මනින් සුර ලෝකෙට යන්න පුළුවන්" ඉතා සුන්දර මුහුණක් හිමි මෙම තරුණයාගේ සිත කොතරම් බිහිසුණු දැයි මහාචාර්යවරයා කල්පනා කළ අතර මෙසේ පැවසී ය.

"මට බැහැ සමාජයට අහිතකර දෙයක් නිර්මාණය කරන්න."

"හරි එහෙමනම් මම යනවා ඔබට ඩොලර් කෝටි 100ක් ලබා ගැනීමට තිබූ අවස්ථාව නැති කර ගන්නයි හදන්නේ! තව ටිකක් හොඳින් කල්පනා කරල බලන්න "

මහාචාර්යවරයාගේ සිතේ පැවති තැන්පත් ශාන්ත බව අභිබවා මුදල් පිළිබඳ ආශාව සිත තුළ මතු වන්නට විය. මට කොච්චර දේවල් කරන්න පුලුවන් ද ඩොලර් කෝටි 100කින් මම කරන වෙනත් සුළු දේවල්වලින් මට ලැබෙන්නේ කොතරම් සුළු මුදලක් ද? සෙල්ඩ්‍රින් තනිව ම සිතන්නට විය. සෑම සත්වයෙකුට ම පොදු වූ තෘෂ්ණා සහගත සිතුවිලි මහාචාර්ය සෙල්ඩ්‍රින්ගේ සිත වෙලා ගන්නට විය. මට අලුත් ගෙයක් ගන්න පුළුවන්. ඇයි වාහනයක්, මෙම මුදල ලැබුණොත් ආයිත් ජීවිත කාලයට ම මුදල් හම්බ කරන්න අවශ්‍ය නෑ ඔහු විසින් තමාට ම කියා ගන්නා ලදී.

"මොකද ප්‍රොෆෙසර් කල්පනා කරන්නේ ?"

"නෑ. මුකුත් නෑ ඔබට අද රාත්‍රී 9.00 ට පෙර දුරකථන ඇමතුමකින් මේක ගැන අවසාන වචනය දෙන්නම්."

"බොහොම හොඳයි මම යනවා එහෙනම්,"

තමාගේ දුරකථන අංකය කුඩා කොළයක ලියූ ඔහු එය මහාචාර්යවරයාගේ අත මත තබා පිටව ගියේය.

පැමිණි අමුත්තා පිටත්ව ගිය මොහොතේ පටන් මහාචාර්යවරයාගේ සිත දෙගිඩියාවකින් පෙළෙන්නට විය. තමන් මෙම මුදල ලබා ගන්නවා ද? නැද්ද? ඔහු නැවත නැවත කල්පනා කරන්නට විය. සිතේ පැවති ශාන්ත හා විද්‍යාත්මක සිතුවිලි පරයමින් ටිකෙන් ටික මුදලට ඇති තෘෂ්ණාව මතු වන්නට වූ අතර, එය සිත පුරා පැතිර යන්නට වැඩි වෙලාවක් ගත නොවී ය. එම රසායනික පළතුර සහිත පැළෑටිය සෑදීමට යටිසිත ඔහුට බල කරන්නට විය.

"සෙල්ඩ්‍රින්. මොනවද ඔයා ඔච්චර කල්පනා කරන්නේ ? මම කාමරයට ඇවිත් ගොඩක් වෙලා ඔයා දැක්කෙත් නෑ." පරීක්ෂණාගාරයේ දොරටුව අසල සිට ඔහු දෙස බලා සිටිමින් ඔහුගේ දයාබර බිරිඳ එසේ පැවසී ය.

"නෑ... මම මේ, දැන් කල්පනා කලේ අද දහවල් මට එක්තරා නාඳුනන පුද්ගලයෙකු ඇවිත් වැඩක් භාර දුන්නා. එය ඉටු කරනවා ද නැද්ද කියලයි කල්පනා කළේ."

"මොකද්ද ?"

"මේ... විෂ වර්ගයක් හදලා දෙන්න කියලා කිව්වා."

“කොපමණ මුදලක් ගෙවනවා කිව්වා ද ?”

“ඩොලර් කෝටි 100ක්.”

“එච්චර ලොකු මුදලක් ඔය වගේ සුළු වැඩකට... අනේ ඕක කරලා ඒ සල්ලි අරගන්න. අපිට ජීවිත කාලය ම ඒ මුදලින් සතුටින් ඉන්න පුළුවන්.”

“ඒත් මගේ හිත මට මේ වැඩය කරන්න එපා කියලා කියනවා. ”

“පිස්සු නැතුව ඔය වැඩය කරන්න. අපි කාටවත් මරන්නෙවත් අමාරුවේ දාන්නෙවත් නැනේ.”

“ඒක තමයි මාත් කල්පනා කළේ. මම ඒක හදලා දෙන්නම්. මගේ ඔය සෙල්ෆෝන් එක ගෙනත් දෙන්න.”

“මෙන්න සෙල්ෆොන් එක, මම යනවා එහෙනම්.”
යයි පවසමින් සෙල්ඩ්‍රින්ගේ බිරිඳ එම ස්ථානයෙන් පිට වී ගියා ය.

මහාචාර්යවරයා තමාට ලබා දුන් දුරකථන අංකය වෙත දුරකථනයෙන් අමතා අදාළ විෂ පැළෑටිය සෑදීමට සිය කැමැත්ත පළ කළ අතර, සිය බිරිඳ සහ කුඩා පුතු බිරිඳගේ මවගේ නිවස බලා පරීක්ෂණ කටයුතු නිම වන තෙක් පමණක් යවන ලදී.යුහුසුළු ව තම පරීක්ෂණ නල ගෙන විෂ ඇපල් පැළෑටියක් තැනීම ආරම්භ කරන ලදී.මේ සඳහා තමන් සතු ජීව විද්‍යාත්මක හා රසායන විද්‍යාත්මක දැනුම ඔහු විසින් යොදා ගන්නා ලදී. දින 13 ක් ඇතුළත මෙම පැළෑටිය අවශ්‍ය බව ප්‍රොයිඩ් විසින් දන්වන ලද අතර, නිදි නොලබා එක දිගට ම සිය පර්යේෂණ කටයුතුවල මහාචාර්යවරයා නිරත වීය.ක්‍රමයෙන් දින ගෙවී ගිය අතර 9 වන දින වන විට පැළෑටියට අදාළ රසායනික සංයෝගය නිපදවා ගත්

අතර,එය වර්ධිත සෛල අඩංගු ඇපල් ඇටවලට මුසු කොට කුඩා පෝච්චියක සිටවී ය. එය මෙතෙක් ලෝකයේ බිහි කළ විස්මිතම නිර්මාණයක් විය. එක් දිනක් තුළ අඩි කිහිපයක් උසට වැඩුණු ඇපල් පැළෑටියෙහි ඊළඟ දිනය වන විට මල් හටගත් අතර 12 වන දිනයේ දී එහි පළමු ඵල දැරීම සිදු විය. ඇපල් ගෙඩි රන්වන් පැහැයෙන් බැබළුණු අතර, ඉතාමත් මිහිරි සුවඳක් දනවන්නට විය. ඇපල් ගස සමග සම්බන්ධ ව පවතින තාක් ඇපල් ගෙඩිවල කිසිදු විෂක් අන්තර්ගත නොවූ අතර, ඇපල් ගෙඩි ගසෙන් කඩනවාත් සමග ම උග්‍ර විෂක් එහි නිර්මාණය වන ලෙස මෙම පැළෑටිය ඔහු විසින් නිර්මාණය කරන ලදී. ගසෙන් කඩාගත් ඇපල් විෂ සහිත වූ අතර, එය අනුභව කරන ඕනෑ ම පුද්ගලයෙකුට විනාඩි 30කට පසු අත්වන ඉරණම මරණය වනු ඇත. සිය ඇපල් පැළෑටිය ගෙඩිත් සමග එළි මහනේ තැබූ අතර කුරුල්ලන් පැමිණ ඇපල් අනුභව කර ඉගිල යන්නට විය.ග සේ ඇපල් රැඳී තිබෙන තුරු එහි කිසිදු විෂක් නොවූ අතර නිරුපද්‍රත ව ඉගිලෙන කුරුල්ලන් විසින් එය තහවුරු කරන ලදී.

ඉන් පසු ඇපල් ගසෙන් ගෙඩියක් කඩා ගත් සෙල්ඩ්‍රින්, ඉන් කුඩා ප්‍රමාණයක් මීයෙකුට කවා පර්යේෂණය සාර්ථක දැයි බැලූ අතර, ඇපල් අනුභව කරන ලද මීයා හරියට ම මිනිත්තු 30කට පසු මිය ගියේ ය.ඇපල් ගස පසෙකින් තැබූ ඔහු ඉතා ප්‍රීතියෙන් තම අනාගතය ගැන සිහින මවන්නට විය.පසු ගිය දින කිහිපයේ නිදි වර්ජිත ව දැඩි වෙහෙසින් යුතු ව කටයුතු කළ නිසා සෙල්ඩ්‍රින්ගේ දෙනෙත් පියවී ඉතා තද නින්දකට පිවිසි අතර පසෙකින් සුවඳ හමන ඇපල් ගස විය.මේ අතර කාලයකට පසුව සෙල්ඩ්‍රින් හමු වීමට ඔහුගේ බාල සොහොයුරා වන ඩග්ලස්, සිය බිරිඳ ජුවානා සමග ඔහුගේ නිවසට පැමිණියේ ය.ගෙදර කිසිවෙකු නොවූ බැවින් සිය බිරිඳ සාලයේ අසුන් ගැන්වූ ඩග්ලස් අගුල් නොදමා තිබූ විද්‍යාගාරයේ දොරටුව විවෘත කරමින් ඒ තුළට පැමිණියේ ය.

සෙල්ඩ්‍රින්ට තදින් නින්ද ගොස් සිටි බැවින්, ඔහු අවදි නොකිරීමට තීරණය කළ ඩග්ලස් විද්‍යාගාරය පුරා සැරිසරමින් එහි වූ විස්මයජනක සතුන් හා පැළෑටි නැරඹූ අතර, ඔහුගේ නෙත් එක්වර ම විද්‍යාගාරයේ කවුළුවෙන් ඉවත තිබූ පුදුමාකාර ඇපල් පැළෑටියක් දෙසට යොමු විය. අඩි කිහිපයක් උස් වූ එහි ඇපල් ගෙඩි රැසක් විය. ඉතා දීප්තිමත් වූ එම ඇපල්වලින් සෞම්‍ය සිත් ගන්නා සුවඳක් ද වහනය විය. කුඩා කුරුල්ලෙකු ගස මතට වී ඇපල් ගෙඩියක් කමින් සිටියේ ය. කෙමෙන් පැළය වෙත ළං වූ ඇලෙක්ස් ඉන් ඇපල් ගෙඩියක් කඩා ගත් අතර, කුරුල්ලෙකු ඇපල් කමින් සිටි නිසා කිසිඳු බියකින් තොර ව එය එකවර ම ආහාරයට ගත්තේ ය. ඉතාමත් මිහිරි රසින් යුතු වූ එම ගෙඩියෙන් කැබැල්ලක් සිය බිරිඳට ද දිය යුතුයැයි සිතූ හෙතෙම එය රැගෙන සාලය වෙත ගමන් කලේය.

"ජුවානා, මේ බලන්න රස ඇපල් වගයක්."

"කෝ කොහෙන් ද මේවා ?"

"මේ සෙල්ඩ්‍රින්ගේ ගෙමිදුලේ තිබුණු අපූරු පැළෑටියකින් දැන් කඩා ගත්තේ. කෑල්ලක් කාලා බලන්න."

ජුවානා විසින් ද ඉන් කැබැල්ලක් ගෙන අනුභව කරන ලදී. එම ඇපල් ඉතා ම ප්‍රණීත විය, මේ අතර එකවර ම පරීක්ෂණාගාරයේ කූඩුවකින් මීයෙක් පරීක්ෂණ නල ගොඩට පැනීම නිසා සෙල්ඩ්‍රින් අවදි වීය. ඔහුගේ නෙත ක්ෂණික ව පසෙකින් වූ ඇපල් ගස දෙස යොමු වූ අතර එහි තිබූ ඇපල් ගෙඩිවලින් ගෙඩියක් අඩු බව වැටහී ගියේ ය. තම සිත ව්‍යාකුලත්වයෙන් පිරී යන්නට වු අතර, කඩිනමින් තම නිවස තුළට පැමිණියේ ය.

"අයියේ, අයියගේ විද්‍යාගාරයේ තිබ්බ ගහේ ඇපල් හරිම රසයි.

මේ ජුවානාටත් කැල්ලක් මං දුන්නා."

එම වදන් ඇසෙනවාත් සමග ම තමාගේ හදවත නවතින්නාක් මෙන් හැඟීමක් දැනෙන්නට විය. සිය සොහොයුරා හා ඔහුගේ බිරිඳ ඇපල් අනුභව කර ඇති බවක් තව මොහොතකින් ඔවුන් මිය යන බවත් වැටහී ගිය අතර තම දෙපා අප්‍රාණික වන බවක් සෙල්ඩ්‍රින්ට දැනෙන්නට විය.තම සොහොයුරාගේ සහ ඔහුගේ බිරිඳගේ මුහුණු තමා බලා සිටියදී ම අහිමි වීම දරාගත නොහැක්කක් වූ අතර ඔහු එකවර ම විද්‍යාගාරය වෙත ගොස් බිත්තියේ ඔළුව ගසා ගත්තේය.

තමන් මුදල් නිසා ලෝක සම්මතයට පටහැනි දෙයක් සිදු කළ බවත්, දැන් තමාට ඊට ප්‍රතිවිපාක වශයෙන් තම සොහොයුරා අහිමි වන බවත් ඔහුට අවබෝධ විය. අවට සියළු දෑ තමා වටේ කැරකෙන්නාක් මෙන් දැනුණු අතර, එම පීඩනය ඔහුට ඔරොත්තු නොදෙන තරම් විය. එකවරම සිය ආදරණීය සොහොයුරා කාමරයට ඇතුළු වූ අතර, ඔහුගේ මුහුණ මැලවී ඇති සැටි සෙල්ඩ්‍රින්ට දැකගත හැකි විය.

"සෙල්ඩ්‍රින් අයියේ, මගෙ බඩ රිදෙනවා. ආ..ආ......"

එසේ පවසත් ම සිය සොහොයුරා බිම ඇද වැටුණු අතර, ඔහුගේ බිරිඳ ද වේදනාවෙන් සාලයේ මහ හඬින් කෑගසනු ඇසෙන්නට විය.තමන් මේ කරගත්තේ කුමක් ද ? තම සිත තමාට ම දොස් නඟන්නට වූ අතර, සිය සොහොයුරා ළඟට ගොස් අත තබා බැලූ විට සෙල්ඩඩ්‍රින්ට දැක ගත හැකි වූයේ ඔහු මියගොස් ඇති බව ය. සෙල්ඩ්‍රින්ගේ දෙනෙත්වලින් රූරා වැටෙන කඳුළු තම දෙකම්මුල් තෙත් කරමින් ගලා යන්නට වූ අතර, තමන් තවත් ජීවත් වීම පවක් බව හැඟී යන්නට විය.

"මම මහා පව්කාරයෙක්. සල්ලිවලට කෑදර ව මම මොකක්ද මේ

කළේ.......?

දැන් ඉතින් මම ජීවත් වෙලා වැඩක් නෑ."

තමාට ම එලෙස කියා ගනිමින් විද්‍යාගාරයේ ඇති බඩු මුට්ටු පොළවේ ගසන්නට වූ සෙල්ඩ්‍රින් හට, ඉතා විෂ සහිත රසායනික ද්‍රව්‍යයක් වූ ඇපල් ගස තැනීමට යොදාගත් රසායනිකය හමු විය. තම අද්විතීය නිර්මාණය වූ ඇපල් ගසට ගිනි තැබූ සෙල්ඩ්‍රින් පරීක්ෂණාගාරයට ද ගිනි තැබී ය.


"මම දැන් ජීවත් වුණා ඇති. මට සමාවෙන්න මම මහා පවුකාරයෙක් මගේ ලෝබකම නිසා මට මගේ සොහොයුරා නැති වුණා"

යනුවෙන් පැවසූ ඔහු විසින් එම විෂ වර්ගය එකවර ම පානය කරන ලදී. හිස කැරකැවෙන්නට වූ අතර, හෘදය නවතින්නාක් මෙන් දැනෙන්නට විය, ඔහු බයිබලය සිහියට නඟා ගන්නට වෑයම් කළ ද ඊට අවස්ථාව මෙය නොවන බව ඔහු විසින් වටහා ගන්නා ලදී. දෙපා වාරු නොමැති වූ සෙල්ඩ්‍රින් ද විද්‍යාගාරය තුළදී ම සිය සොහොයුරා ළඟ ඇඳ වැටිණ.

මිය ගොස් සිටි සෙල්ඩ්‍රින්ගේ සිරුර ඇමරිකානු බුද්ධි අංශය මඟින් සොයා ගත් අතර, කුමක් සිදු වීද යන්න ඔවුන්ට මහත් ප්‍රහෙලිකාවක් විය. සෙල්ඩ්‍රින්ගේ දැවී අළු වී ගිය පරීක්ෂණාගාරයට මුද්‍රා තබන ලද අතර, ඔහුගේ දැවී අළු වී ගිය සිරුර පොලිසිය වෙත රැගෙන යන ලදී. ඇමරිකාවේ ශ්‍රේෂ්ඨ විද්‍යාඥයෙකුගේ අවසානය, ගෞරව කිරීමට පවා දේහයක් ඉතිරි නොකරමින් සිදු විය.



View publication stats



## දිය යටින් කිමිද ගියෙමි

අනුල් සමරසේකර යනු ගැඹුරු මුහුදේ කිමිදීම සඳහා සබ්මැරීන් යානා නිෂ්පාදනය කරන සමාගමක් වන Ocean Gates සමාගම විසින් තෝරා ගනු ලැබූ ලාංකික මහාචාර්යවරයාය. 2023 වසරේ Titan සබ්මැරීනය Titanic නෞකාව අසලට යෑමට තැත් කිරීමේදී පුපුරා යාමත් සමගින් එහි නවතම නිෂ්පාදනය භාර වූයේ අනුල්ටය. මීට පෙර Ocean Gates සමාගම විසින් නිෂ්පාදනය කර තිබූ ටයිටෑන් සබ්මැරීනයට කිමිදීමට හැකියාව තිබුණේ අඩි 13,000 පමණ වුවද මෙම නව සබ්මැරීනය අඩි 26,000 ක් පමණ දිය යට කිමිදීමට සමත් ය. අනුල් ජීව විද්‍යාව, යාන්ත්‍රික විද්‍යාව සහ සාගරික විද්‍යාව පිළිබඳව ආචාර්ය උපාධිධාරියෙකි. විෂයන් ත්‍රිත්වයක් සම්බන්ධයෙන් ලාබාලතම මහාචාර්යවරයා අනුල්ය. ඔහු විසින් නිපදවන ලද නවතම සබ්මැරීන් යානය Titan 2 ලෙස නම් කළ අතර එහි නිෂ්පාදන කටයුතු සියල්ල මේ වන විට සිදු කර හමාරය. අනුල් මහතා විසින් සිය සබ්මැරීනයේ ප්‍රථම දිය යට කිමිදීමේ පරීක්ෂණය හෙට දින එනම් 2024 දෙසැම්බර් 22 දින සිදු කිරීමට සියලු කටයුතු මේ වන විට සංවිධානය කර හමාරය. නැගෙනහිර ක්ෂිතිජය දෙසින් හිරු උදාවත්ම සිය සගයන්ට සහ දෙමාපියන්ට සමු දුන් අනුල් සිය සබ්මැරීනයේ ප්‍රථම පරීක්ෂණය සඳහා දිය යටට දියත් කරන ලදී. එදින ඉතා පැහැබර දිනයක් වූ අතර සාගරයෙහි කිසිදු කැලඹිලි ස්වභාවයක් දක්නට නොවීය. තමා විසින් ම නිපදවන ලද මෙම සබ්මැරීනයෙන් ප්‍රථම වතාවට දිය යටින් අඩි 20,000 පමණක්ම ගැඹුරට කිමිදීම තමා ලද මහත් භාග්‍යයක් කොට අනුල් විසින් සලකනු ලැබීය. මෙය

සාගර ගවේෂණයේ යෝධ පිම්මක් වන අතර කිසිදිනෙක මිනිසා ගමන් නොකළ දුරක් දිය යට ගමන් කිරීමට බලාපොරොත්තු වීම මෙහි විශේෂත්වය විය. Titan 2 සබ්මැරීනය ක්‍රමයෙන් මුහුදු පතුලට යාම ආරම්භ කළ අතර ඉතා විසිතුරු මසුන් රංචු පිටින් ඒ මේ අත ගමන් කරනු අනුල්ට දැක ගත හැකි විය.

මුහුදු පතුල යට හොඳින් ආලෝකය වැටී තිබූ අතර එම නිසා පැහැදිලිව ජලය හරහා සියලු දේ දර්ශනය කර ගැනීමට අනුල්ට හැකි විය. අඩි 3,000 සීමාව පසුවත්ම ක්‍රමයෙන් විසිතුරු මසුන් ජලය තුළ ගමන් කරනු දක්නට නොවූ අතර ඒ වෙනුවට දුඹුරු සහ රතු පැහැයෙන් යුත් මෝරුන් සහ මුහුදු අශ්වයින් වැනි සතුන් පමණක් දක්නට විය. අඩි 5,000 සීමාව පසුවත්ම මුහුද තුළ වූ ආලෝකය ක්‍රමයෙන් අඩු වූ අතර දැඩි අඳුරක් මුහුද තුළ පැතිර යන්නට විය. ජලයේ පීඩනය ක්‍රමයෙන් අධික වූ අතර ඒ සඳහා ඔරොත්තු දෙන විශාල මත්ස්‍යයින් පමණක් මුහුද තුළ ඒ මේ අත යනු දක්නට විය. අනුල් විසින් සිය සබ්මැරීනයේ සියලුම විදුලි පහන් දැල්වූ අතර දැන් තම යානය අවට තමන්ට හොඳින් දැක ගත හැකි විය. ක්‍රමයෙන් තවදුරටත් මුහුදු පතුලට යානය ගමන් කරන්නට වූ අතර ක්‍රමක්‍රමයෙන් මුහුදු ජීවීන්ගේ දැක ගැනීම අඩු වන්නට විය. මුහුද යට ගැඹුරින් අඩි 12,000 පසු වනවාත් සමගම මුහුදු පතුල තුළ දක්නට ලැබුණේ බූවල්ලන් සහ විශාල තල්මසුන් පමණක් වූ අතර අනෙකුත් කිසිදු ජීවියකු එහි දක්නට නොවීය. අඩි 13,000 සීමාවට ළං වෙනවාත් සමගම අනුල්ට ඈතින් Titanic නෞකාවේ සුන්බුන් දක්නට ලැබුණු අතර තමා පෙර Titan සබ්මැරීනය ගමන් කළ සීමාව පසු

කරන බව අනුල් ට අවබෝධ විය. දැන් අනූල් ක්‍රමයෙන් මුහුදු පතුලේ අඩි 15,000 සීමාවට ළඟා වී ඇති අතර මෙය නවතම ගිනස් වාර්තාවක් බව ඔහුට සිහි විය. තමා අඩි පහළොස් දහසේ සීමාවට ළඟා වී ඇති බව ගොඩබිම් මත සිටින තම සගයන්ට දැනුම් දුන් අනුල්ට තමා හා තම යානය පිළිබඳ සියුම් ආඩම්බරයක් ඇති විය. මෙය මනුෂ්‍යයකු මුහුදු පතුලේ ගමන් කල වැඩිම දුර බවත් මීට පෙර කිසිවෙකු මෙතරම් දුරක් මුහුදු පතුල තුළ කිමිදී නොමැති බවත් දැනෙන විට අනුල්ට විශාල ප්‍රීතියක් ඇති විය. ඉහළින් දැනෙන දැඩි පීඩනය දරා ගනිමින් යානය තවත් මුහුදු පතුලට ගමන් කරන්නට වූ අතර කිසිදු ජීවියකු මුහුදු පතුල තුළ දක්නට නොවීය. දැඩි අන්ධකාරයක් මුහුදු පතුලේ සෑම තැනම දක්නට වූ අතර මෙය මධ්‍යම රාත්‍රියේ දී පාළු සොහොනක ගමන් කරන්නාක් බඳු විය. මුහුදු පතුල ඉතා නිශ්චල වූ අතර කිසිදු ශබ්දයක් හෝ කිසිදු ජීවියකු එහි දක්නට නොවීය. දැන් යානය මුහුදේ අඩි 20,000 සීමාවට ළඟාවී හමාර ය. අනුල්ව පුදුමයට පත් කරමින් ඉතා ඈත මුහුදු පතුලේ කෙළවරකින් ආලෝක කදම්බයක් විහිදෙන බව ඔහුට දක්නට ලැබුණි. මෙතරම් ඈත ගැඹුරු මුහුදේ දක්නට ලැබෙන ආලෝක කදම්බය කුමක් විය හැකි දැයි අනුල් මවිතයට පත් විය. යානයේ පරිගණක තිරයේ දක්නට ලැබෙන දත්ත වලට අනුව අදාළ ආලෝක කදම්බය විහිදෙන්නේ අඩි 25,550 පමණ පහලින් බව අනුල් අවබෝධ කරගන්නා ලදී.

අනූල් සිය යානය ක්‍රමයෙන් එය දෙසට පැද වූ අතර ක්‍රමයෙන් ඒ දෙසට ලංවත්ම අනුල්ට දක්නට ලැබුණේ ඉතා විශාල පිරමීඩයකින් අදාළ ආලෝක කදම්බයන් නිකුත්වන

බව ය. පිරමීඩයේ සවිකර තිබූ ඉතා විශාල ආලෝකය නිකුත් කරන පාෂාණ වර්ගයකින් ආලෝක කදම්බයන් නිකුත් වන බව අනුල්ට ඉතා පැහැදිලි විය. පිරමීඩයෙන් නිකුත් වූ ආලෝකයෙන් මුහුදු පතුල ඒකාලෝක වූ අතර පිරමීඩයේ සෑම තැනකම තරු රටා, ඉර, හඳ වැනි සලකුණු කොටා තිබෙනු අනුල්ට පැහැදිලිව දක්නට හැකි විය. පිරමීඩයේ පෘෂ්ඨයක් දිගේ සබ්මැරීනය පහළට ගෙන යෑමට අනුල් තීරණය කරන ලද අතර ආසන්නයේම ඇති පිරමීඩයේ පෘෂ්ඨය ඔස්සේ යානය පහළට ගෙන යාම ආරම්භ කරන ලදී. මෙම පිරමීඩය පිළිබඳව විස්මයජනක ආරංචිය ගොඩබිම වෙත ලබා දිය යුතු යැයි තීරණය කල අනුල් ඒ සඳහා තම සන්නිවේදන පරිපථය ක්‍රියාත්මක කරන ලදී. අනුල්ව පුදුමයට පත් කරමින් සියලුම සන්නිවේදන පරිපථ කිසියම් බාහිර බලපෑමක් වන රාවන් 2 මගින් විසන්ධි කර ඇති බව පරිගණක තිරය මත දක්නට විය. නැවත ගොඩබිම වෙත යන්නේ ද ඉදිරියට ම ගමන් කරන්නේ ද යන දෙගිඩියාවෙන් ඔහුගේ සිත පෙලෙන්නට වූ අතර තීරණයක් ගැනීමට අවශ්‍ය මොහොතකට තමන් පැමිණ ඇති බව අනුල්ට සිහිපත් විය.

ඉදිරියටම ගමන් කළ යුතු යැයි ද මෙම අභිරහසෙහි සුලමුල සොයා ගත යුතු යැයි ද සිතූ අනුල් ඉදිරියටම ගමන් කිරීම ආරම්භ කරන ලදී. පිරමීඩය දිගේ පහළට ගමන් කළ අනුල්ට පහත විශාල දොරටුවක් ඇති බව දැකගන්නට හැකි විය. දොරටුව දෙපස බිත්ති වල මෙතෙක් කිසි දිනක දක්නට නොලැබුණු තරු රටා දහයක් දොළහක් පමණ කොටා තිබූ අතර ඒවා කුමක්දැයි සිතමින් යානය කෙමෙන් දොරටුව වෙත පහත් කරන්නට අනුල් ක්‍රියා කළේය. යානය දොරටුව වෙත

ගෙනියනවාත් සමගම පිරමීඩෙහි දොරටුව ඉබේම විවෘත වූ අතර අනුල් යානය දොරටුව තුළින් ඇතුලට ගෙන යන ලදී. පිරමීඩය ඇතුළතට යානය ඇතුළු කළ අනුල්ට දක්නට ලැබෙන දෙයින් ඔහු පුදුමයට පත් විය. පිරමීඩය ඇතුළත පිට්ටනියක් වැනි අංශක තුන්සිය හැට පුරාම විහිදුණු විශාල ගෝලාකාර අවකාශයක් දක්නට ලැබුණු අතර සෑම තැනකම දොරටු දක්නට විය. එම සෑම දොරටුවකට ම උඩින් තරු රටාවල සලකුණු දක්නට විය. ඒ සමගම කිසිවෙකු කතා කරන හඬ අනුල්ට ඇසෙන්නට වූ අතර එය තම කණට ඇසෙන්නේ ද නැතිනම් මනසට දැනෙන්නේ ද යන්න තේරුම් ගැනීම අපහසු විය. ''ඔබ අනුල් සමරසේකර, මහාචාර්යවරයෙක් පෘථිවි වර්ෂ 2024 සිට පැමිණ තිබෙනවා. කරුණාකර ඔබගේ යානය පරීක්ෂා කිරීමට අවසර දෙන්න.''

යානය පහළට ගන්නවාත් සමගම අනූල් මෙසේ විමසීය.

''ඔබ කවුද ? මෙම ස්ථානය කුමක්ද ?''

''මම රාවන් 2 ස්වයංක්‍රීය රොබෝ යන්ත්‍රයක්. ඔබ මේ පැමිණ සිටින්නේ මහා රාවණා රජුගේ අධිරාජ්‍යයේ තාරකා දොරටුව වෙතයි. රාවණා රජු මෙයින් පිටව යෑමෙන් පසු මෙහි පැමිණි පළමු තැනැත්තා ඔබයි.

''රාවණා රජු පිටව ගියා! කොහාටද ?'' අනුල් ක්ෂණිකව විමසීය.

''අවසාන වතාවට මීට අවුරුදු 5,502 කට පෙර රාවණා රජු මෙම තාරකා දොරටුව භාවිතා කර ඔරායන් තරු පන්තියේ

සීරියස් තාරකාව වෙත පිටව ගියා. ඉන් පසු මෙහි පැමිණි පළමු තැනැත්තා ඔබයි.''

''එතකොට රාවණා රජු, රාම රජු සමග යුද්ධයේදී මිය ගියේ නැද්ද?''

''ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් දත්ත මා සතුව නැහැ. නමුත් රාවණා රජු නැවත නොපැමිණි බව නම් මට සහතිකවම  පැවසිය හැකියි. කරුණාකර, ඔබට යාමට අවශ්‍ය තාරකා පන්තිය තෝරාගන්න. අදාළ දොරටුවෙන් යානය සෙමෙන් ඇතුළු කරන්න.''

අසන්නට සහ දකින්නට ලැබෙන දේවල් වලින් මේ වන විටත් අනුල් වික්ෂිප්තව සිටියේය. නැවත ගොඩබිම වෙත ගොස් මේ සියල්ල පැවසිය යුතු බව අනුල් ට සිහිපත් විය. නමුත්  යානයේ පරිගණක තිරය දෙස බැලූ අනුල් දුටුවේ යානයේ ඉන්ධන අවසන් වී ගෙන එන බවය. තමා නොදැනුවත්වම බොහෝ කාලයක් මුහුදු පතුල තුළ ගත කර ඇති අතර නැවත ගොඩබිම කරා යෑමට ඉන්ධන ප්‍රමාණවත් නොවන බව අනුල්ට අවබෝධ විය. කළ හැකි අන් කිසිවක් නොවන බව තීරණය කළ අනුල් රාවණා රජු පිටව ගිය තාරකා දොරටුවෙන්ම සීරියස් තාරකාව අයත් තරු පන්තිය වෙත පිටත්ව යාමට තීරණය කළේය.

වටපිට බැලූ අනුල් ඔරායන් තරු පන්තිය සහිත දොරටුව ඉක්මනින්ම හඳුනාගත් අතර පෘථිවියට සමුදෙමින් යානය ඒ තුළට පැදවීය. යානය අදාළ දොරටුවෙන් ඇතුළු කරනවාත් සමඟම යානය ඉතා වේගයෙන් භ්‍රමණය වීමට පටන් ගත්තේය. ඒ හා සමගම තමන්ට ක්ලාන්ත ගතියක් ඇති වන්නාක් මෙන් අනුල් ට දැනෙන්නට විය.

නැවත සිහිය ලැබෙන විට තමා වටා අමුතු ජීවීන් පිරිසක් රැස්ව සිටි අතර එක් පුද්ගලයකු පමණක් ඔවුන්ගෙන් වෙනස් බව අනුල් ක්ෂණිකව හඳුනා ගන්නා ලදී. අනුල් ළඟට පැමිණි ඔහු කතා කිරීම ආරම්භ කළේය. කතා කිරීමේ දී හෙළ බස ඔහු භාවිතා කළ අතර අනුල්ට පැහැදිලිව එම බස හඳුනාගත හැකි විය.

''මම රාවන් සමහරු රාවණා රජු කියලත් මට කියනවා.''

අනුල්ට ඇස් අදහා ගත නොහැකි විය. තමා දැන් සිටින්නේ ශ්‍රේෂ්ඨ අධිරාජ්‍යයකු වන මහා රාවණා රජු ඉදිරියේ බව ඔහුට ක්ෂණිකව වැටහී ගියේය. නමුත් වෘතාන්ත කතාවල සඳහන් වන පරිදි දේහධාරී සිරුරක් හෝ කුරිරු මුහුණක් ඔහු සතු නොවීය. ඉතා ප්‍රසන්න මුහුණක් ඔහුට තිබූ අතර, දිගට වැඩුණු රැවුලත්, වවා තිබූ කොණ්ඩයත් නිසා ඍෂිවරයෙකු ගේ පෙනුමක් ඔහු තුළින් දිස්විය. ඇඳ සිටි ඇඳුමත්, අඩි දහයක් පමණ උස් වූ පෙනුමත් නිසා ඔහු තුළින් ඉතා තේජාන්විත බවක් දිස්විය. ''අපි හිතුවේ ඔබ රාම රජු සමග යුද්ධයේදී මිය ගියා කියලයි ඒක වැරදි ද?''

''ඒක වැරදියි. සීතා දේවිය පැහැර ගත් එකත් වැරදියි. මම කවදාවත් ඒ වගේ දේවල් අනුමත කරන්නේ නැහැ.

''රජතුමනි ඔබ නෙමේද එහෙනම් ඒ දේවල් කළේ ?''

''නැහැ.''

''මම ශ්‍රේෂ්ඨ විද්‍යාඥයෙක්, වෛද්‍යවරයෙක්, ඒ වගේම රණශූරයෙක්. මම සිදුකළ කිසිම යුද්ධයක් මම පරදින්නේ

නැහැ. මා ළඟ විවිධ පිටසක්වල ග්‍රහලෝක වලින් සහ අනාගතයට ගමන් කිරීම තුළින් එකතු කරගත් අති නවීන විශාල ආයුධ ප්‍රමාණයක් තිබෙනවා. ඒවා සමඟ සටන් කිරීමට කිසිවකුට නොහැකියි.''

''මම ඔරායන් තරු පන්තියට එන විට රට රැක බලාගැනීම සඳහා මගේම ක්ලෝනයක් නිර්මාණය කලා. ඔහුට රට බලා ගැනීම භාර දීලා මම විවිධ තරු පන්ති අතර ගමන් කරන්න පුරුදු වුනා. ඒ අතර වාරයේ ඔහු තමයි සීතාව පැහැරගෙන ආවේ. යුද්ධ කළෙත් ඔහුයි. මෙහි තාරකා දොරටුවේ ප්‍රශ්නයක් නිසා මට නැවත යන්න බැරි වුණා. ඔහොම තමයි ඔය දේවල් සිද්ද වුනේ.''

''මම පෘථිවියත් එක්ක සන්නිවේදනය කරන්න ක්‍රම හදා ගත්තා. හැබැයි තාරකා දොරටුව නම් අනිත් පැත්තට විවෘත කරගන්න බැරි වුනා. එතකොට දැන් අපට පෘථිවියට යන්න බැරිද?''

''තවම බැහැ. හැබැයි මම පුළුවන් තරම් ඉක්මනින් තාරකා දොරටුව නැවත හදනවා.''

''දැන් ලෝකයේ ගොඩක් ප්‍රශ්න ඇති වෙලා තියෙන්නේ. රටවල් බෙදිල යුද්ධ කරනවා. ඊට අමතරව ලෙඩ රෝග හැම තැනම පැතිරිලා. බෙහෙත් නැති ලෙඩ රෝග ගොඩක් තියෙනවා.''

''ඔබ දන්නවද? මම විෂයන් 25 කට විතර බොහොම දක්ෂ පුද්ගලයෙක්. මට කාලය හරහා ගමන් කරන්න පුළුවන්. අනාගතය දකින්නත් පුළුවන්. යම්කිසි සීමාවකට අනෙක්

අයගේ සිත් කියවීමටත් හැකියි. ඔබ ඔය කියන ලෙඩ රෝග සෑම එකකටම බෙහෙත් හදන්නත් පුළුවන්. ඒ වගේම මම අමරණීයයි. දැනට අවුරුදු පන්දහකටත් වැඩිය ජීවත් වෙලා තියෙනවා. මේ අත්දැකීම් සියල්ලත් එක්ක මට පුළුවන් නැවත පෘථිවිය යථා තත්ත්වයට ගන්න.

''එහෙනම් අපි හිතන එක දෙයක් හරි. පෘථිවියේ මිනිස්සු බලාපොරොත්තු වෙනවා අනාගතයේ පෘථිවිය බේරා ගැනීමට දියසෙන් කියලා කෙනෙක්, ඒ කියන්නේ රාවණා රජ්ජුරුවන්ගේ ආත්මයත් පහළ වෙයි කියලා. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ මිනිස්සු ඒ සම්බන්ධයෙන් ලොකු බලාපොරොත්තුවකින් ඉන්නෙ.''

''ඒකනං හරි මේ තාරකා දොරටුව හදපු ගමන් හැකි ඉක්මනින් අපි පෘථිවියට යමු. මෙහේ එක දවසක් කියන්නේ පෘථිවි අවුරුදු පහක් විතර. අපිට තව මෙහෙ කාලයෙන් අවුරුද්දක්වත් ගත වෙයි මේ තාරකා දොරටුව හදලා ඉවර කරන්න. ඒ කියන්නෙ අපිට නැවත පෘථිවියට යන්න තව අවුරුදු 1,500 වැඩිය කාලයක් ගත වෙයි. ඒ කියන්නේ අපිට රාවණා රජ්ජුරුවන්ගේ නැවත ආගමනයක් පෘථිවියට බලාපොරොත්තු වෙන්න පුළුවන් වෙන්නේ වසර තුන්දහස් ගණන්වල.''

''ඔබ හරි අනුල් !''

අනුල්ගේ සිත දැඩි වේදනාවකින් පිරී යන්නට විය. එනම්, තවත් වසර 1,500 ගතවන විට තමන් ජීවතුන් අතර නොසිටීම ඊට හේතුවයි. තමාට කිසි දිනක නැවත පෘථිවියට

යාමට නොහැකි බව දැන් ස්ථිරය. නමුත් රාවණා රජුගේ පෘතුවියට නැවත පැමිණීමක් නම් ස්ථිරය.

දැන් කිසිවක් සිදු කිරීමට කාලයක් නොමැත. රාවණා රජුගේ අධිරාජයත්, රාවණා රජු පිළිබඳවත්, රාවණා රජුගේ නැවත පැමිණීම පිළිබඳවත් දන්නා එකම පෘතුවි වාසියා තමන් වීම අනුල්ගේ සතුටට හේතු විය. නමුත් කිසිදා පෘථිවියට නැවත යාමට නොහැකි බව දැනෙන විට ඇති වූ දුක එම සතුට යටපත් කරමින් අනුල්ගේ සිතෙහි නැගෙන්නට විය. සිදුවූ සියල්ල චිත්‍රපටයක දර්ශන මෙන්ම අනුල්ගේ සිතෙහි නැගෙන්නට වූ අතර දෑස් පියාගෙන නින්දට වැටුණේ නව ජීවිතයට කෙසේ හෝ පුරුදු විය යුතු යැයි යන දැඩි අධිෂ්ඨානයෙනි.